# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,860 — 1969 ජූනි 27 වැනි සිකුරාදා — 1969.6.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... | 1081 | කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 1104 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 1087 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 1087 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | 1110 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 1102 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... | 1110 |
| බඩු බාහිරාදිය විකිණීම ... | 1103 | විවිධ දැන්වීම් ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට යනිම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ආර්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 38 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(අ) ආධුනික/පරීක්‍ෂා සේවා කාලය අවසානයේදී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළදී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාල පරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්‍ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේය. ස්වකීය ආධුනික/පරීක්‍ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේය.

**සංලක්‍ෂ්‍යය.**—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්‍ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්‍ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තාවූ ද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නො වන්නේ ය.)

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**— මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්‍ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔව්හු 1945 අගෝස්තු මස 15 වෙනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඇතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ දෑතුර තමන් සේවයෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාගීයෙනි. එතෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරනලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද්දැයි සඳහන් කොට එවිය යුතුය.

ii) සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්‍ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්‍ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්‍ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්‍ෂකයකු තෝරා ගැණුම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතු වනේම ඒ අපේක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. **සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.**—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ පාසල්වල උපගුරු තනතුරු

රජයේ පාසැල්වල උපගුරු තනතුරු සඳහා, සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගුරු සහතික පත්‍ර විභාගයෙන් හෝ ඉංග්‍රීසි උපගුරු සහතික පත්‍ර විභාගයෙන් හෝ සමත් වී ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. දැනට සේවයේ සිටින ශිෂ්‍ය ගුරුවරුන් මෙම නිවේදනය අනුව අයදුම්පත් නො එවිය යුතුය.

2. මෙහි පහත දැක්වෙන ආදර්ශ ෆෝර්මය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1969 ජූලි මස 18 වැනි දින හෝ ඊට ප්‍රථම, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, පාඨශාලා පරිපාලන ශාඛාවේ, ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත් බහා ලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, "උපගුරු තනතුරු—සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගුරු සහතික පත්‍රධාරීන්" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. **සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්‍ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) 1969 ජූලි මස 18 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ 45 ට වැඩි හෝ නො වන බවට, (මෙම උපරිම වයස් සීමාව දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්තව සිටින්නන් සඳහා අදාල නොවේ).

(ii) සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගුරු සහතික පත්‍රය දරන බවට;

**නැතහොත්**

ඉංග්‍රීසි උපගුරු සහතික පත්‍රය දරන බවට;

(iii) විශිෂ්ට චරිත ශුද්ධියකින් යුක්ත බවට.

4. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් ඈමිණිය යුතුය :—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

සැ. යු.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ පිළිගනු නොලැබේ :—

(ආ) ලබාගත් ගුරු සහතික පත්‍රය;

(ඉ) චරිත සහතික දෙකක්. (ඉන් එකක් තම ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගෙන් විය යුතුය).

5. සේවයට භාර ගැනීම හා සේවා කොන්දේසි.—

(i) මෙම තනතුර ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) මෙම තනතුරුවලට පත්වීම් ලබන්නන් විසින් ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුපට දායක වීම අවශ්‍යය. පත්වීම් ලබන පිරිමි අපේක්‍ෂකයන් විසින් ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) පත්වීම් ලබන්නෝ දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ නියුක්තව නොසිටිත් නම් ඔවුන්ගේ පත්වීම් අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ. දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවයේ නියුක්ත වූවත් අවුරුද්දක කාලයක් තනතුරෙහි වැඩ බැලීම අවශ්‍ය වේ.

(iv) පත්වීම සඳහා තෝරාගනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමැති බව හා ඊට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(v) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව පත්වීම් ලබන්නන් ක්‍රියා කළ යුතුය.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ වෙනත් ලිපි ස්ථිර ලේකම් වෙත එවිය යුතු අතර මෙම අමාත්‍යාංශයේ වෙනයම් නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි වෙත අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත් පිළිගනු නො ලැබේ. තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් වෙතොත් එය මග හැරවීම සඳහා සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
වැ. බ. ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

පාප/12/307
1969 ජූනි මස 17 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### රජයේ පාසැල්වල උපගුරු තනතුරු

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. විවාහක අවිවාහක බව (විවාහක නම් ස්වාමිපුරුෂයා/භාර්යාව රජයේ සේවකයෙක්ද/සේවිකාවක්ද විස්තර සඳහන් කරන්න :————.

5. අයදුම්කරුගේ උපන් දිනය :————.

6. උපන් ස්ථානය :————.
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඉ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (ඊ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා :————.

7. ජාතිය : (ලාංකික වූයේ පරම්පරාවෙන්ද, ලියා පදිංචි කිරීමෙන්ද ?) :————.

8. අධ්‍යාපනික සුදුසුකම් :————.

9. සිංහල පිළිබඳ සුදුසුකම් :————.

10. වෘත්තීය සුදුසුකම් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. කලින් සේවය :————.
   (i) ගුරුවරයෙකු/වරියක වශයෙන් :————.
      (අ) ලියා පදිංචි කළ අංකය :————.
      (ආ) සේවා විස්තර :————, දින සිට :————.
      දින දක්වා
      දැරූ තනතුර :————.
   (ii) වෙනත් රජයේ, සේවකයෙකු/සේවිකාවක හෝ වශයෙන් සේවය අවසන්වීම/අත්හිටුවීම/ ඉල්ලා අස්වීම/නිදහස් කිරීමට හේතු (සම්පූර්ණ විස්තර සඳහන් කළ යුතුයි) :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මා රජයේ සේවයෙන් පහකරනු ලැබූවකු නොවන බවත්, රජයේ සේවය හැර ගිය අයෙකු ලෙස සලකා සේවය නතර කිරීමක් සිදුවී නැති බවත්, උත්පත්තියෙන්/ලියාපදිංචි කිරීමෙන් මා ලාංකිකයෙකු බවත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මා සතුටු බවත් මෙයින් සහතික කරමි. මෙම අයදුම් පත්‍රයෙහි දැක්වෙන යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ මා තෝරා ගැනීමට පෙර එළිදරව් වුවහොත් එයින් මා නුසුදුස්සකු වන බවත්, එම දෝෂය පත් කිරීමෙන් පසුව එළිදරව් වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම පිළිගනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6--1030—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## යාපනය දිස්ත්‍රික්කයේ උඩුප්පිඩ්ඩි කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ වඩමරාච්චි කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

උඩුප්පිඩ්ඩි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසින්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමා අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියලු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1969 ජූලි මස 31 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඇම්. ඇස්. රාජසිංහම්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1969 ජූනි මස 13 වෙනි දින,
යාපනය, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී ය.

6–977—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### රජයේ විද්‍යාලයන්හි චිත්‍රකර්ම උපගුරු තනතුරු

යථෝක්ත මැයින් අංක 14,855 හා 1969.5.22 වැනි දින දරන ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ පළ කරන්නට යෙදුන නිවේදනය කෙරෙහි මෙයින් අවධානය යොමු කරවනු ලැබේ.

2. එම නිවේදනය යටතේ අයදුම්පත් භාර ගැනීම 1969.8.31 වැනි දින තෙක් දීර්ඝ කරනු ලැබේ. එම නිවේදනය යටතේ අයදුම්පත් දැනටමත් එවා ඇති අයදුම්කරුවන් නැවත වරක් අයදුම් පත් නො එවිය යුතුය.

3. අයදුම්පත් 1969.5.22 දින දරන ගැසට් නිවේදනයෙහි දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුවම පිළියෙල කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. 1969.8.31 වැනි දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
වැඩ බලන ස්ථිර ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

පාප 12/296
1969 ජූනි මස 19 දින,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
පාසල් පරිපාලන ශාඛාවේ දී ය.

6–1140—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා පුහුණුව

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා අංශය සංවිධානය කරන මේ දෙසති පුහුණුව සඳහා සුදුසු ගුරුවරුන්, ගුරුවරියන් තෝරා ගැනීමට මෙහි දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළිවෙළ කැරෙන ඉල්ලීම්පත්, 1969 ජූලි 12 දින දක්වා භාර ගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ උඩ වම් කෙළවරෙහි "ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා පුහුණුව" යනුවෙන් සඳහන් කර, කොළඹ 2, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන හා පුස්තකාල සේවා අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

2. මේ පාඨ මාලාව සිංහල, දෙමළ මාධ්‍ය දෙකින් ම පැවැත් වේ.

3. ඉල්ලුම්කරුවන් ගුරු විදුහලක පුහුණුවකින් පසු ස්ථිර සේව යෙහි යෙදී සිටින්නන් විය යුතුය.

4. 1969 ජූලි 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

5. තෝරාගනු ලබන අයට කොළඹ, අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙසතියක් තුළ පැවැත්වෙන පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා නිල නිවාඩු, යැපීම් දීමනා, පාඨමාලාව ආරම්භයේ පැමිණීමටත් අවසානයේ ආපසු යාමටත් රාජකාරි දුම්රිය බලපත්‍ර ලැබේ.

6. පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ විට සහතිකයක් පිරි නැමේ.

7. ආපසු සේවයට යැවෙන විදුහලේ ඉගැනුම් උදවු මධ්‍යස්ථානයේ (විදුහල් පොත් ගුලේ සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ) කටයුතු පැවරෙනු ඇත.

8. විදුහලේ දී ඒ කටයුතු වල යෙදෙන පැ ගණන ඉගැන්වීමේ යෙදී සිටි ලෙස සලකනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
වැඩ බලන ස්ථිර ලේකම් සහ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1969 ජූනි මස 18 වෙනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

### ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා ගුරු පුහුණුව (ඉල්ලීම් පත්‍රය)

1. සම්පූර්ණ නම :————.
(මෙනෙවිය/මහත්මිය/මහත්මා)

2. උපන් දිනය සහ 1969 ජූලි 1 දිනට වයස :————.
අවු :————, මාස :————.

3. පදවිය සහ ගුරුවරයකු වශයෙන් ලියා පදිංචි අංකය :————.

4. විදුහලේ ලිපිනය :————.

5. ගෙදර ලිපිනය :————.

6. ගම් ප්‍රදේශය :————.

7. ගැහැණු/පිරිමි බව :————.

8. විවාහක/අවිවාහක බව :————.
විවාහක නම් හිමියා/බිරිය රැකියාවක් කරයිද ?————.
ඔහුගේ/ඇගේ රැකියාවේ තොරතුරු :————.

9. වෘත්තීය සුදුසුකම් :—
පුහුණු වූ ගුරු විදුහල :————.
කාල සීමාව :————.
සහතිකයේ අංකය, වලංගු දිනය :————.
එහි සඳහන් විෂයයන් :————.

10. වෙනත් සහතික :————.

11. භාෂා දැනුම :—
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

සමත් වී ඇති උසස් ම විභාගය :—
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

12. පොත්ගුල් සංවිධානය පිළිබඳ ලබා ඇති සුදුසුකම් සහ පළ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

13. ඉගැනුම් උදවු, තැනීම සහ භාවිතය පිළිබඳ ලබා ඇති විශේෂ සුදුසුකම් සහ පළපුරුද්ද :————.
(ප්‍රොජැක්ටර්, ටේප් රැකෝඩර්, ආදී උපකරණ භාවිතය ගැන පුහුණුවක් ඇත්නම් සඳහන් කරන්න.)

14. විශේෂ ලැදිකම් :————.

15. විශේෂ දක්ෂකම් :————.

16. වෙන වෘත්තියක යෙදී සිටියේ නම් ඒ තොරතුරු :————.

17. පුස්තකාලයක සාමාජිකත්වය දරන්නේ නම් ඒ විස්තර :————.

18. අදාළ වෙනත් තොරතුරු :————.

19. සැබෑ නිවැරදි තොරතුරු ම විසින් මෙහි සැපයූ බව පවසමි.
————.

අත්සන :————.
දිනය :————.

20. විදුහල්පති අනුමතිය :—

........................................ විදුහලේ සේවය කරන
................................ මෙනෙවිය/මහත්මිය/මහත්මා

මේ පුහුණුව සඳහා ඉතා සුදුසු/සුදුසු/නුසුදුසු බව සහතික කරමි. දෙසතියක පුහුණුව සඳහා මේ ගුරුවරයා/ගුරුවරිය නිදහස් කළ හැකිය/නොහැකිය.

————.
විදුහල්පති.

දිනය :————.

6–1058—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### අම්පිටිය දුබලයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වැඩ කළමනාකරු තනතුර

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අම්පිටිය, දුබලයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වැඩ කළමනාකාර තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙළ කර ගතයුතු ඉල්ලුම් පත්‍ර 1969.7.24 වැනි දින හෝ ඊට පෙර කොළඹ 3, බාලදක්ෂ මාවත, ගාලු මුවදොර, සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප.**—මෙම තනතුරට නියමිත වැටුප් පරිමානය වර්ෂයකට රු. 3,420—4×120—8×180—රු. 5,340 වේ. (රුපියල් 4,080 හා රු. 4,800 වාර්ෂික වැටුප ලැබීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු රාජ්‍ය සේවා අර්ථ සාධක අර මුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම—

(අ) 1969.7.24 වැනි දිනට වයසින් අවුරුදු 25ට නොඅඩු බවටත්, අවුරුදු 45 ට නොවැඩි බවටත්,

(සංලක්ෂ්‍යය—දෙපාර්තමේන්තුවේ සේවකයින්ට මෙම වයස් බලපාන්නේ නැත.)

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල/දෙමළ භාෂාව, ගණිතය/අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී ලබා ගන්නා ලද අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය පෙළ) සහ එයට අමතරව පහත සඳහන් සහතික පත්වලින් එකක් ලබා තිබීම :—

(i) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ සහතිකය (යාන්ත්‍රික හා විදුලි කාර්මික)

හෝ

(ii) අම්පාරේ හාඩි කර්මාන්ත ආයතනයේ ඩිප්ලෝමා සහතිකය

හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ සන්ධ්‍යා යාන්ත්‍රික ඉංජිනේරු සහතිකය

හෝ

(iv) සමාන සුදුසුකම්, සහ

(ආ) පිළිගත් ආයතනයක කාර්මික වැඩ සම්බන්ධයෙන් යටත් පිරිසෙයින් පස් අවුරුද්දක පළපුරුද්දක්.

**සටහන :** ගොඩනැගිලි තැනීම සම්බන්ධව ප්‍රායෝගික අත්දැකීමක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

(ඇ) යහපත් කල් ක්‍රියාවෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියමිත දිනට පෙර ලැබී ඇත්නම් හා ප්‍රමාදයට වලංගු හේතු දක්වමින් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඒවා පිළිගන්නා මෙන් නිර්දේශ කළහොත් මිස නැත්නම් පිළිගනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියවිලි (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහතිකය හෝ පිළිගනු නොලැබේ.)

(ආ) 4 වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපනික, කාර්මික හා අනෙක් සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික පත්‍ර.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව පිළිබඳ සහතික පත්‍ර දෙකක් (දැනට රජයේ සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් මෙම උපඡේදයන් නියමිත සහතික ඉදිරිපත් කළයුතු නොවේ.)

7. අයදුම්පත් හෝ ඊට අදාල වෙනත් ලිපි ආදිය හෝ එවිය යුත්තේ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුට පුද්ගලිකව නොවේ.

8. ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන කාණ්ඩයේ ආරම්භයේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

ආර්. එල්. තිරුචෙල්වම්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1969.6.20 වැනි දින,
කොළඹ 3, තැ. පෙ. 577,
බාලදක්ෂ මාවත,
ගාලු මුවදොර,
සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දීය.

### ආකෘති පත්‍රය

**අම්පිටිය දුබලයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ වැඩ කළමනාකාර තනතුර සඳහා අයදුම් පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින් ලියන්න) :—
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.
2. ලියුම් ලැබෙන පිළිවෙල :————.
3. (අ) 1969.7.24 වැනි දිනට නියම වයස :— අවුරුදු :— මාස :—, දින :—.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුයි)
4. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලාංකිකයෙකු වන්නේ :—
   (i) පරම්පරාවෙන්ද :————.
   (ii) ලියාපදිංචි වීමෙන්ද :————.
5. විවාහක අවිවාහක බව :————.
6. අධ්‍යාපනික සුදුසුකම් :—
   (අ) (i) සිංහල :————.
   (ii) දෙමළ :————.
   (iii) ඉංග්‍රීසි :————.
   (ආ) කාර්මික සුදුසුකම් :————.
   (ඇ) විශේෂ සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි)
7. මේ භාෂාවන් හොඳ හැටි කථා කිරීමට හා ලිවීමට ඔබට හැකිදැයි දන්වන්න :—
   (අ) සිංහල :————.
   (ආ) දෙමළ :————.
   (ඇ) ඉංග්‍රීසි :————.
8. පාසැලෙන් අස්වූ පසු යෙදී සිටි රැකීරක්ෂා පිළිබඳ විස්තර දක්වන්න :————.
9. ඔබේ හැකියාවන් හා චරිතය පිළිබඳව අසා දැනගත හැකි ප්‍රසිද්ධ හවතුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දන්වන්න : ————.
10. අමුණන ලද චරිත සහතික පත් දුන් හවතුන් දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6–1057—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### (අනියම්) ඉංග්‍රීසි ලඝුලේඛක පුරප්පාඩුව

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. සුදුසුකම්, පළපුරුද්ද ආදිය සවිස්තරව සඳහන් කරමින් අයදුම් පත්‍රය පිළියෙල කොට 1969 ජූලි මස 15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "කොළඹ 2, තැ. පෙ. 544, ජාතික නිවාස කොමසාරිස්" වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් මෙම කාර්යාලය මගින් නිකුත් කරනු නොලැබේ. අයදුම් පත්‍රය එවන කවරයේ වම්පස මුදුන් කෙළවරේ "ඉංග්‍රීසි ලඝුලේඛක තනතුර සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පතක් ඉංග්‍රීසි දැන්වීමට යාකොට ඇත.

3. **සේවා කොන්දේසි :—**

තෝරාගත් අයදුම්කරු, හුදෙක්ම අනියම් පදනමක් මත පත්කරනු ලැබේ. රජය යටතේ හෝ වෙනයම් ආයතනයක් යටතේ හෝ ස්ථිර හෝ තාවකාලික තනතුරක් සඳහා කිසිම විශේෂ හිමිකමක් මෙම පත්වීම නිසා නොලැබේ. ස්ථිර පත්වීමක් කළ වහාම හෝ, සේවය අවශ්‍ය නොවූ විට, ඔහුගේ/ඇගේ සේවය අවසන් කරනු ඇත. පසුව නැවත සේවය ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ "එක්ස්" ශාඛාවේ ලියාපදිංචිවීමට අයිතිවාසිකමක් ඔහුට/ඇයට නොලැබේ.

4. **වැටුප :—**

වැඩ කරන එක් දිනකට රුපියල් 3.50 කි. ආණ්ඩුවේ ගෙවන ප්‍රමාණයන්ට අනුව ජීවනාධාර, විශේෂ ජීවනාධාර හා ගෙවීමට හැකි අනිකුත් දීමනාවල් ගෙවනු ලැබේ.

5. **සුදුසුකම් :—**

(i) යටත් පිරිසෙයින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පාසැලක කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (ඉංග්‍රීසි) සමත්වී සිටිය යුතුය. ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති අය, සිය අයදුම්පත්වල එම විභාගය සඳහන් කළ යුතු අතර, සමත්වී ඇති ඒ ඒ විෂයයන් ඉදිරියෙන් ලැබූ සමර්ථය කුමක්ද යන්න එනම්, විශිෂ්ඨ, සම්මාන හෝ සාමාන්‍ය ආදි වශයෙන් සඳහන් කළ යුතුය.

(ii) විනාඩියකට වචන 80 කට නොඅඩු ලඝුලේඛන වේගයක් හා විනාඩියකට වචන 7 කට නොඅඩු පිටපත් කිරීමේ වේගයක් ද තිබිය යුතුය.

(iii) විනාඩියකට වචන 30 කට නොඅඩු යතුරුලන වේගයක් තිබිය යුතුය.

ඩී. රාජේන්ද්‍ර,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ 2.
1969 ජූනි 18.

6–1054—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## පරිපාලන අභ්‍යාස ආයතනය

### ආචාර්ය හා පර්යේෂණ කාර්ය මණ්ඩලය

උක්ත මැයෙන් අංක 14,858 හා 1969.6.13 දින දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වෙනි ඡේදයේ පළ කර ඇති නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එම නිවේදනයෙහි දැක්වෙන "සේවා කොන්දේසි" හා "අයදුම් පත්" පහත දැක්වෙන අන්දමට නිවැරදි කර ඇති බව මෙයින් දන්වමි.

**සේවා කොන්දේසි.**—පුහුණුවීමේ කාල පරිච්ඡේදයෙන් පසු අවුරුදු 6 ක කාල පරිච්ඡේදයක් පරිපාලන අභ්‍යාස ආයතනයෙහි සේවය කරන බවට ගිවිසුමකට අත්සන් කිරීමට තෝරා ගනු ලැබූ අයදුම්කරුවෝ සූදානම් විය යුතුය. ඔවුන්ට දැනට ලැබෙන වැටුපට අතිරේකව රු. 2,400 ක වාර්ෂික දීමනාවක් ගෙවනු ලැබේ.

**අයදුම්පත්.**—ආදර්ශ අයදුම්පත් ආකෘතියක් යටින් දක්වා ඇත. අයදුම්පත් 69.7.15 දිනට හෝ ඊට ප්‍රථම පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ, අංක 32, ග්ලේන් ආබර් පෙදෙස, කොළඹ 3 වෙත ලැබෙන ලෙස සාමාන්‍ය මාර්ගයෙන් මගින් එවිය යුතුය.

එච්. ඇස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ.

6–1073—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

ඒ. 44/එක්ස්. 2107/69

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හස්ත කර්මාන්ත පිළිබඳ අධ්‍යාපන උපදේශක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හස්ත කර්මාන්ත පිළිබඳ අධ්‍යාපන උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1969 ජූලි මස 11 වැනිදා.
(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර—1969 ජූලි මස 18 වැනිදා.

සටහන් :—

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නො වූද තම ලිපිනය ලියන ලද්දා වූ ද මුද්දර නො ඇලවූ වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයක් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස, විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයන් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත් දරු හා විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. කාන්තාවක් මෙම තනතුරට පත්කරන ලද නම් ඇයට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභයක් හිමිවනු ඇත. ඇය විසින් තමාගේ වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. නිලධාරිනියක අවුරුදු 10 ක සේවය සම්පූර්ණ කිරීමට පෙරාතුව විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීම හෝ අර්ථ සාධක අරමුදලට තවදුරටත් දායකවීම හෝ සඳහා සිය මනාපය ඇය විසින් පළකල යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරියක ලෙස හෝ අර්ථ සාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනටමත් අවුරුදු 10 ක සේවය කර ඇත්නම් මෙම පත්වීම ලැබී මාස 6 ක් ඇතුළත ඇයගේ මනාපය පළකල යුතුයි.

(ii) පත්වීම පළමු වරට අවුරුදු තුනක ආධුනික කාලයකට යටත් වේ. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරාගනු ලැබුවහොත් ඔහු පළමු වරට එක් අවුරුදු වැඩ බැලීමකට යටත්ව පත් කරනු ලැබේ.

3. **වැටුප් සහ දීමනා.**—රු. 5,520 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 360 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් ද, රු. 480 ක වාර්ෂික වැටුප් වැඩිවීම් 2 කින් ද, වාර්ෂික වැටුප රු. 7,320 කට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉමකින් ද යුක්තව වාර්ෂික වැටුප රු. 9,360 දක්වා නගින වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් ය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1969 ජූලි මස 11 දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(ඇ) (i) පරීක්ෂක ශ්‍රේණියේ 7 වර්ෂයකට නො අඩු පළපුරුද්දක් ඇති හස්ත කර්මාන්ත පරීක්ෂකවරයෙකු/පරීක්ෂිකාවක වීම ; හෝ

(ii) කර්මාන්ත කලා ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ හා/හෝ පාලනයෙහි යටත් පිරිසෙයින් පස් වර්ෂයක පළපුරුද්දක් සමග පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම ; හෝ

(iii) කර්මාන්ත කලා ක්ෂේත්‍රයෙහි ඉගැන්වීමේ හා/හෝ පාලනයෙහි යටත් පිරිසෙයින් දස වර්ෂයක පළපුරුද්දක් සමග කර්මාන්ත කලා පිළිබඳ පිළිගත් ඩිප්ලෝමාවක් හෝ වෘත්තීය පුහුණු ගුරු සහතිකයක් තිබීම.

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය හෝ වෙනත් උසස් විභාගයකදී හෝ තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ විෂයයන් එකකින් සමර්ථ වී සිටිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම්

සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුනට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්, ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද, ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 ජූනි මස 19 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
නැ. පෙ. 500.

6–1157—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මොරටුව කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයට සිසුන් ඇතුළත් කිරීම—1969-70

**පාඨ මාලාව : උසස් කාර්මික විද්‍යා ඩිප්ලෝමා**

ලංකා උසස් කාර්මික විද්‍යායතනය විසින් 1969-70 අධ්‍යයන වසරට උසස් කාර්මික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලත් අයගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

(අ) 1968 දෙසැම්බර් මාසයේ පවත්වන්නට යෙදුන අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී :—

භෞතික විද්‍යාව
රසායන විද්‍යාව
ශුද්ධ ගණිතය
ව්‍යවහාර ගණිතය යන සියළුම විෂයයන්ගෙන් සාමාර්ථය ලත් අය.

(ආ) 1968 දෙසැම්බර් මාසයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී මුළු ලකුණු ප්‍රමාණය ඉහලින් ලබා අඩු වශයෙන් ඉහත සඳහන් විෂයයන් 3 කින් සාමාර්ථය ලබා ඇති අය.

2. 1969 ඔක්තෝබර් 1 වෙනි දිනට වයස අවුරුදු 17 හෝ ඊට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම මේ සඳහා ඉල්ලුම් කළ හැක.

3. මේ සඳහා නියමිත අයදුම්පත් පෝර්ම මොරටුව, කටුබැද්දේ, ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ලේඛකාධිකාරී තැනගෙන් ලබා ගෙන, 1969 ජූලි 20 වෙනි දින හෝ ඊට පෙර ඔහුට ලැබෙනසේ එවිය යුතුය.

4. ලංකා උසස් කාර්මික විද්‍යායතනය එක්සත් ජාතීන්ගේ විශේෂ අරමුදලේ අනුග්‍රහය ලබා පාලනය වන අතර, සිවිල් යාන්ත්‍රික, විදුලිය ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ කර්මාන්තවලයින් පුහුණු කිරීමේ පාඨමාලා පවත්වනු ලැබේ. රජයේ හෝ පිළිගත් ජාතික කාර්මික ව්‍යාපාරවල හෝ සුදුසු අංශයන්හි දොලොස් මසකට නොඅඩු කාලසීමාවක් කාර්මික ප්‍රායෝගික පුහුණුවක් ද මෙම පස් අවුරුදු පාඨ මාලාවට ඇතුළත් වේ. මින් ලබන ප්‍රායෝගික පුහුණුව රැකියාවල් සඳහා පිළිගනු ලැබේ. මෙම පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයට ඉංජිනේරු උපාධියට සමාන ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ලැබේ.

5. 1969 ඔක්තෝබර් මාසයෙන් ආරම්භවන අධ්‍යයන වර්ෂය වෙනු වෙන් සිවිල් ඉංජිනේරු අංශයේ 30 දෙනෙකුද, යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ 30 දෙනෙකුද, විදුලිය, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ ඉංජිනේරු අංශයේ 45 දෙනෙකු සඳහා ඉඩකඩ තිබේ.

ආර්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද, මොරටුව,
1969 ජූනි 17 වැනි දින.

6–1026—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩුගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්—තැපැල් ලිපිනය : 418 වැනි තැපැල් පෙට්ටිය,—කොළඹ 1—කපු කැන්වස් සැපයීම සඳහා 1969 සැප්තැම්බර් මස 30 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී **ටෙන්ඩර්කරුවන්ට** ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්ත මේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 සැප්තැම්බර් 29 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශීය ටෙන්ඩර්කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර පෝරම සකස් කළ තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1969 ජූනි මස 27 වැනි දින.
කොළඹදීය.

6–1197—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

**ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි**

කොළඹ චාමස් ධාන්‍යාගාරයේ තිබෙන 70,859 ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්පත් 1969 ජූලි 1 වෙනි දින අඟහරුවාදා සවස 2.30 දක්වා අංක 330, යුනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

රු. 500 ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම් වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි වේ.

එම්. බී. බී. පීරිස්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1969.6.18 දින,
කොළඹ, 330, යුනියන් පෙදෙසේදීය.

6–1052—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969—70 කෑම ද්‍රව්‍ය සැපයීමට ටෙන්ඩර් කැඳවීම

1969–70 මුදල් වර්ෂය තුල බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ආයතනවලට කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් ('' ලාංකික '' යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙක් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. ශ. | |
| මීගමුව බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 19.7.69 |
| කරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය, වතුපිටිවෙල | 50 | 0 | 1,000 | 19,7,69 |
| එළිමහන් සිරකඳවුර, කෝපායි (යාපනය) | 50 | 0 | 1,000 | 19.7.69 |
| එළිමහන් අභ්‍යාස විද්‍යාලය, කල්දෙන (බදුල්ල) | 50 | 0 | 1,000 | 23.7.69 |
| බදුල්ල බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 23,7,69 |
| මඩකලපුව බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 23.7.69 |
| අනුරාධපුර බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 23.7.69 |
| ගාල්ල බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 25.7.69 |
| මාතර බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 25.7.69 |
| තංගල්ල බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 25.7.69 |
| අලුත්කඩේ බන්ධනාගාරය | 50 | 0 | 1,000 | 25.7.69 |

2. ආහාර සඳහා ගණන් ඉදිරිපත් කිරීමේදී බත්, පාන්, තේ, සීනි, පරිප්පු, වියලි මිරිස්, සුදුරු සහ කොත්තමල්ලි යන ද්‍රව්‍යයන් ඇතුලත් නොකොට ගණන් ඉදිරිපත් කළ යුතු බව හා (සියලුම ආයතනයන් සම්බන්ධයෙන් බත්, පාන්, තේ, සීනි, පරිප්පු, වියලි මිරිස්, සුදුරු සහ කොත්තමල්ලි ආදී ද්‍රව්‍යයන් අත්හැරීමෙන් ආහාර මිශ්‍රණයේ වෙනස් කම් ඇති කර ඇති බවද, අනුරාධපුරය, කෝපායි, බදුල්ල, කල්දෙන සහ වතුපිටිවෙල සම්බන්ධයෙන් එළවළු අත්හැරිය යුතු බව ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් දැනගත යුතුව ඇත.

3. එක් ආයතනයක් සඳහා සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා '' සභාපති ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 9 '' කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරී ඩබ්ලිව්. ජේ. ද සිල්වා මහතාට භාරදී එය ලැබුනු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලුකවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ '' ..............ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය '' කියා ලියා මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට ලැබෙන සේ එවිය යුතුයි. මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ 9, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාගේ කාර්යාලයේදී (බන්ධනාගාර මූලස්ථානය) ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්වරයාගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නො ලැබේ. එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට (ඉහත 1 වැනි ඡෙදයේ බලන්න) පෙර දින ප.ව. 3.30 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සසන තැබිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානකාර්යාලයේ හෝ කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10 ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තව ද, කොන්ත්‍රාත් කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලින් රු. 3,000 ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම කොන්ත්‍රාත්කරුවන්ට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩකරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ නො එසේව එහි ගෙන ගොස් භාර දුන් හොත් එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුනු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛන සඳහා තැන්පත් කරනු ලබන මුදල් වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරනු ලබන ගණන් ඉලක්කමින් මෙන් ම වචනයෙන් ද සඳහන් කළයුතු බවත්, එසේ එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන්, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටුකරන වගට, ඇප කරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටුකරන වගට අවශ්‍ය තරම් ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කිරීමට අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරය. ඒ ඒ බන්ධනාගාර අධිකාරි තැනගෙන් කොන්ත්‍රාත්තුව හරියාකාර කිරීමට වුවමනා කරන සියලු තොරතුරු දැනගත හැකිය.

13. ඒ ඒ ටෙන්ඩරය සඳහා වන සියලු කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නොලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂෙප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීම හෝ බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවෙකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ බලය යම් පුද්ගලයෙකු වෙත පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරින්ට සෑහෙන තරම් කරුණු ඇත්නම් කිසියම් පුද්ගලයකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවීම ගැන තම විරුද්ධත්වය ලියා දනුම් දිය හැක. එවැනි කිසිම පුද්ගලයකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටුකිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථමයෙන් රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී තමාගේ සම්පූර්ණ නම් ස්ථිර ලිපිනය, තමන්ට අයිති දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදයම් පාළක තැන විසින් සහතික කරන ලද වාර්තාවක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන නිළධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් හා දේපොළවල ප්‍රමාණය හා වටිනාකම එහි සඳහන් කළ යුතුයි.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එසේ සේවය ඉටු කරන ලද්දේ, දනට ටෙන්ඩර් කැඳවන දිස්ත්‍රික්කයේ හෝ කොට්ඨාශයේ හෝ සඳහා නොවේ නම්, තමන් විසින් එසේ කොන්ත්‍රාත්තුව ඉටුකරන ලද පළාත් හෝ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුයි.

(ඇ) වෙන දෙපාර්තමේන්තුවකට කොන්ත්‍රාත්තුව ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එම දෙපාර්තමේන්තුවේ නම සහ තමා සේවය කළේ කුමන දිස්ත්‍රික්කයේද යනවග සඳහන් කරමින් ඒ බවට එම දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිළධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේද, ගිණිය යුත්තේද, ලංකාණ්ඩුව යටතේ දනට එම පදවිය දරන්නාවූ නිළධාරියාද, ඔහුට පසුව එම පදවිය දරන්නාවූ නිළධාරියාද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථානයෙන් ලබාගත හැක.

ඇජ්. ඩී. ඇල්. රත්නායක.
බන්ධනාගාර කොමසාරිස්,

කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය.
1969.6.18.

6–1138—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

### මන්නාරම දිස්ත්‍රික්කයේ ළිං සෑදීමේ වැඩ

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ කිරීම සඳහා 1969 ජූලි 12 වැනි දින පෙරවරු 12 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(1) වට්ටුපිතාන් මඩු පොදු ළිඳ—ගැඹුර අඩි 40, විෂ්කම්භය අඩි 8 යි.

(2) පරප්පුකඩන්තාන් පොදු ළිඳ—ගැඹුර අඩි 30, විෂ්කම්භය අඩි 8යි.

(3) මුරුන්කන් පොදු ළිඳ—ගැඹුර අඩි 60, විෂ්කම්භය අඩි 8 යි.

(4) කරඩිකුලි පොදු ළිඳ— ගැඹුර අඩි 60, විෂ්කම්භය අඩි 8 යි.

(5) පූනෝච්චිකුලම් හෙවත් පීපී. පොට්කර්ණී පොදු ළිඳ—ගැඹුර අඩි 60, විෂ්කම්භය අඩි 8 යි.

මෙම වැඩ සඳහා 1969 ජූලි මස 10 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝර්ම, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුයි. වැඩි විස්තර සහ උපදෙස් මන්නාරම දිසාපතිගෙන් ලබාගත හැක. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද ටෙන්ඩර් කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති හා සමූපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. බාහිර ටෙන්ඩර්කරුවන් විසින් ඉල්ලුම්කරන විටදී, ඉල්ලුම්කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 ක් බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර සමිතිවලටද මෙම තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය ය.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිසාපති.

1969. 6. 19 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දී ය.

6–1069—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කොළඹ උප කොටස

කොළඹ උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1969 ජූලි 15 වන අඟහරුවාදා පෙරවරු 11 දක්වා ජාවත්ත පාරේ කොළඹ 5, බස්නාහිර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් බාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩය ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක :—

| වැඩයේ නම | | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වූ ගණන. | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| 1. බරාව ව්‍යාපාරයේ නාවින්න ඇල හරහා සුළු ගංවතුර වැලැක්වීමේ නිර්මානයක් තැනීම | ... | 38,000 | ... | 50 |
| 2. පට්ටිවිල සුළු ගංවතුර වැලැක්වීමේ ව්‍යාපාරය අළුත්වැඩියා කිරීම | ... | 31,000 | ... | 50 |

3. 1969 ජූලි මස 12 වෙනිද දක්වා කාර්යාල වේලාවන් තුළදී කොළඹ/කළුතර/ගම්පහ/රත්නපුර වාරිමාර්ග ඉංජිනේරුවන් ගේ කාර්යාලයන් ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පොර්මවල ටෙන්ඩර් අයදුම් පත සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට පෙර එම වැඩය ඉදිරියෙන් සඳහන් කර ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්යාලවලදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් 1969 ජූලි මස 12 වෙනි දින හෝ ඊට පෙර කාර්යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

4. මෙම් වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය හා කාර්යාල වේලාවන් තුලදී කොළඹ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

අයි. එච්. පෙරේරා,
වාරිමාර්ග ඉංජිනේරු,
කොළඹ උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ජාවත්ත පාර, කොළඹ 5.

6—1056—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1969 ජූලි මස 22 වෙනි අඟහරුවාද පෙ.ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ:—

| | වැඩ විස්තරය | | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල | | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| 1. | බුන්නැහැපොල මීගහනැම් බැම්ම | ... | 40,000 | ... | 50 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 ජූලි මස 18 වෙනි සිකුරාද (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළ දී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සළකා බැලීම සඳහා වාර්මාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිත්තාසියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩර්ය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවෙන් තුළ දී කුරුණෑගල උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේගෙන් ලබාගත හැක.

එල්. හරිදස,
වාරිමාර්ග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය.

1969 ජූනි මස 16 වැනි දින,
කුරුණෑගල වාරිමාර්ග කායසීාලයේ දීය.

6–1047—€9.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාගී දෙපාතීමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් විවිධ සේවා සමුපකාර සමිතිවලින් ග්‍රාමසංවර්ධන සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### ටෙන්ඩර් විස්තර

#### වතුරුගම, ග. ව. නි.

(1) අංක 86 බැලුම්මහර ගො. කා. ස. ප්‍ර. ගල්ඔලුව යාය අංක 1 අමුණේ ජලදොර තැනීම.

(2) අංක 86 බැලුම්මහර ගො. කා. ස. ප්‍ර. බැලුම්මහර යාය අමුණ තැනීම.

(3) අංක 107 දඹුගමුව, හල්ගම්පිටිය ගො. කා. ස. ප්‍ර. ඔතුකඹුරායයේ මැද ඇල අමුණ තැනීම.

#### හංවැල්ල, ග. ව. නි.

(4) අංක 299 කොස්ගම ඉහල ගො. කා. ස. ප්‍ර. මල්පැලියද්ද අමුන තැනීම.

(5) අංක 306 බටවල ගො. කා. ස. ප්‍ර. වල්පිටවෙල මැද ඇල අමුණු දෙකක් තැනීම.

(6) අංක 308 මීගොඩ ගො. කා. ස. ප්‍ර. ඉරවල්ල මුල් වක්කඩ අමුණ තැනීම.

(7) අංක 309 පානළුව ගො. කා. ස. ප්‍ර. පහල බටයාවල අමුණ තැනීම.

(8) අංක 313 උග්ගල්ල අංගම්පිටිය ගො. කා. ස. ප්‍ර. පල්ලේවෙල අමුණ තැනීම.

(9) අංක 301 කඩුගොඩ ගො. කා. ස. ප්‍ර. කඩුගොඩ පට්පිය ඕවිට අමුණ තැනීම.

#### බරාව සංවර්ධන ව්‍යාපාරය

(10) අංක 306 බටවල ගො. කා. ස. ප්‍ර. මාවකඩ ඇල හරහා යෝජිත සුළු ගංවතුර නැවැත්වීමේ නිර්මාණකය තැනීම.

(11) ඇලවත්ත ඇල හරහා යෝජිත සුළු ගංවතුර නැවැත්වීමේ නිර්මාණකය තැනීම.

(12) අරවස්කඩ ඇල හරහා යෝජිත සුළු ගංවතුර නැවැත්වීමේ නිර්මානකය තැනීම.

(13) පුස්සැලි ඔයේ වම් ඉවුරේ ගංවතුර නැවැත්වීමේ බැම් තැනීම.

#### කඳාන ග. ව. නි.

(14) හොරගොල්ල ගො. කා. ස. ප්‍රදේශයේ අළුපොත ඇල හරක් පැන්නුම තැනීම.

(5) බටගම දකුණ ගො. කා. ස. ප්‍රදේශයේ මැද ඇල හරක් පැන්නුම තැනීම.

(16) බොල්ලත ගො. කා. ස. ප්‍රදේශයේ ගොරකගහ මුදුන් ඇල අමුන තැනීම.

#### කිරිදිවැල ග. ව. නි.

(17) හිස්සැල්ල ගො. කා. ස. ප්‍රදේශයේ මටදොඹගහවෙල හිස්සැල්ල අමුන තැනීම.

(18) පනාවල ගො. කා. ස. ප්‍රදේශයේ දූනගෙදර යායට ලැලි ඉබි යතුරු දමා ප්‍රතිසංස්කරණය කිරිම.

#### මීගමුව ග. ව. නි.

(19) අංක 125 උම්බුකුලිය උඩගොඩ ගොවි කාරක සභා ප්‍රදේශයේ උඩගොඩ ඇල ශුද්ධ කිරීම.

(20) අංක 119 පැතිගොඩ බඩල්ගම ගොවි කාරක සභා ප්‍රදේශයේ පැතිගොඩ ඇල ශුද්ධ කිරීම.

(21) අංක 122 පහළ සම්පැල්ල ගොවි කාරක සභා ප්‍රදේශයේ දලුපත්යාය පැතිබැම්ම බැඳීම.

(22) අංක 124 කොන්දගම්මුල්ල ගොවිකාරක සභා ප්‍රදේශයේ තිත්තගල් ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

#### මිනුවන්ගොඩ ග. ව. නි.

(23) අංක 137 හොරම්පැල්ල ගො. කා. ස. ප්‍රදේශයේ අස්සැන්නාවත්ත—ආදශී කුඹුරුයායේ ජලදොර තැනීම.

(24) අංක 137 හොරම්පැල්ල ගො. කා. ස. ප්‍රදේශයේ හොරම්පැල්ල මාවෙල්යාය ඇල තුම්මෝදර පැති බැම් තුනක් බැඳීම.

#### හෝමාගම ග. ව. නි. කොට්ඨාශය

(25) දැඩිගමුව—රණාල ගො. කා. ස. ප්‍රදේශයේ හිනදුරාව ජල ප්‍රමානකය තැනීම.

(26) දැඩිගමුව ගො. කා. ස. මැද ඇලට පයිප්ප සැපයීම හා ආරක්ෂක බැම් තැනීම.

(27) පනාගොඩ-ගොඩගම ගො. කා. සා. බටදොඹගහකුඹුර විරුක්වර් මංකඩ තැනීම.

(28) පනාගොඩ-ගොඩගම ගො. කා. ස. මීදෙල්ලගහ කුඹුර ජල ප්‍රමාණයක තැනීම.

#### නුගේගොඩ ග. ව. නි. කොට්ඨාශය

(29) තලංගම උතුර ගො. කා. ස. ප්‍රදේශයේ මැද ඇල සුද්ධ කිරීම.

(30) පැපිලියාන ගො. කා. ස. ප්‍රදේශයේ ගංගොඩවෙලයාය මැද දෙපාඇල සුද්ධ කිරීම.

(31) උඩහමුල්ල-තලපත්පිටිය ගො. කා. ස. ප්‍රදේශයේ බැබිලහන්දියේ සිට කුඹුලාවල දක්වා ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

(32) බත්තරමුල්ල ගො. කා. ස. ප්‍රදේශයේ මහතියර ප්‍රතිසංස්කරණය කිරීම හා ගවපැන්නුමක් තැනීම.

#### කඩවත

(33) මාකොල ගො. කා. ස. ප්‍රදේශයේ අඹගහවෙල අමුණ තැනීම.

(34) වැටකෙයාව කුඹුර විරුක්වර් පැන්නුම හා බුන්කිඳ කුඹුර විරුක්වර් පැන්නුම තැනීම.

(35) මීගහවත්ත ගො. කා. ස. ප්‍රදේශයේ දෙල්ගොඩ අමුණ ප්‍රතිසංස්කරණය කිරීම.

#### පිළියන්දල

(36) සිද්ධමුල්ල ගො. කා. ස. ප්‍රදේශයේ පුවක්ගහදෙනියයායේ වම් පිට ඇල සුද්ධ කිරීම.

(37) කහතුඩුව ගො. කා. ස. ප්‍රදේශයේ බැදිදෙනියායායේ බස්නා ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

(38) හල්පිට ගො. කා. ස. ප්‍රදේශයේ මිදෙල්ල වැටියයායේ වම්පිට ඇල ප්‍රතිසංසක්රණය කිරීම.

(39) වැතර-අම්බලන්ගොඩ ගො. කා. ස. ප්‍රදේශයේ මිදැල්ලගහ දෙනියයායේ පිට ඇලවල් සුද්ධ කිරීම.

(40) කිරිවත්තුඩුව ගො. කා. ස. ප්‍රදේශයේ කිතුලවිල දෙනියේ සිට දෙනිගහ ඇල දක්වා දෙපාඇල ශුඩ කිරීම.

(41) මාම්පෙ-කැස්බෑව ගො. කා. ස. ප්‍රදේශයේ මරඩාවිල සහ ගලගාව දෙනියේ පිට ඇලවල් සුද්ධ කිරීම.

(42) කිරිවත්තුඩුව ගො. කා. ස. ප්‍රදේශයේ යකහළුයායේ බස්නා ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 ජූලි මස 11 දින දවල් 12 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන්, හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයක් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "..................................... සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 ජූලි මස 14 දින දවල් 12 ට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමග නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුළදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක් දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 ජූලි මස 15 දින පෙ. ව. 9.30 ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අ. සේ. ගුණතිලක,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 ජූනි මස 18 දින දී ය.

6-1070—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, මරදානේ ටියුනීසියා ගබඩාවට පහත සඳහන් හොඳ පරණ ගිස්ගෝනි සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1969 ජූලි 11 වැනි සිකුරාදා ප. ව. 2.30 වනතෙක් බාරගනු ලැබේ.

බුසල් $2\frac{1}{2}$ (දෙකහමාරේ) ගෝනි 1,00,000 ක් හාල් මැනීමට.

බුසල් $3\frac{1}{2}$ (තුනහමාරේ) ගෝනි 1,00,000 ක් වී මැනීමට.

2. කොළඹ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරී තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි. මි. යෝ. ක්‍රා. හා වී කෙ. අංශයට ඉදිරිපත් කර ටෙන්ඩර්පත් ලබාගෙන අනු පිටපතක් ද සහිතව පුරවා එවිය යුතුය. 1969 ජූලි 11 වැනි සිකුරාදා දවල් 12 වනතෙක් ටෙන්ඩර්පත් බාරගනු ලැබේ.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ටියුනීසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරී තැනගෙන් විමසා දැන ගත හැක.

වී. පී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 ජූනි 20 වැනි දා,
කොළඹ 7.

6-1071—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අභ්‍යන්තර දහන එන්ජින්වලට සම්බන්ධකරන ලද කේන්ද්‍රාපසාරි පොම්ප 50 ක් සහ නැවුන්දෙන ප්ලාස්ටික් පයිප්ප දනට තිබෙන තොගයෙන් සැපයීම සඳහා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජූලි මස 11 වැනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 ඡේදයෙහි සඳහන්වන දිනයෙහි එකී වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අධ්‍යක්ෂ යේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

3. ටෙන්ඩර් කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් (ව්‍යාප්ති) 1969 ජූලි මස 10 වැනි දින දහවල් 12 තෙක් ඉල්ලුම්කොට ලබාගත හැකි ඉල්ලුම් පත්‍ර ෆෝර්මවල ලියා ඉදිරිපත් කළ යුතුය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ අභ්‍යන්තර දහන එන්ජින්වලට සම්බන්ධ කරන ලද කේන්ද්‍රාපසාරි පොම්ප 50 ක් සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියාපදිංචි තැපැල මගින් ද, ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒවා ලැබුණ බව දැන්වීමට බලය දී සිටින පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන් හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තරද ටෙන්ඩර්කරුගේ නාම හා ලිපිනයද ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.)

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50 ක් කොළඹ යෝක් වීදියේ, ලංකා බැංකු ශාඛාවෙහි, කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට බැරකර හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නාමට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ තැන්පත් කර, ඒ බවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 9, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ව්‍යාප්ති අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකගෙන් ඉල්ලුම්කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි දැනගත හැකිය.

ඊ. එල්. ඒෆ්. අබේරත්න,
කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1969 ජූනි මස 18 වැනි දින.

6–1060—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## වනසත්ව දෙපාර්තමේන්තුව

කලාඔය හි දඩයම් ආරක්ෂක නිවාසයක් තැනීම සඳහා සීල් කරන ලද ටෙන්ඩර්පත්‍ර කොළඹ 1, ඇචිලන් චතුරශ්‍රයේ, වන සත්ව දෙපාර්තමේන්තුවේ, වන සත්ව භාරකාර විසින් 1969 ජූලි මස 25 වැනි දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. 1969 ජූලි මස 20 වැනි දින පස්වරු 3 දක්වා කාර්යාල වේලාවන් හිදී ආපසු ගෙවිය හැකි රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් . ටෙන්ඩර් ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

3. මෙම සේවාව සඳහා ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "කලාඔය හි දඩයම් ආරක්ෂක නිවාස තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලියා ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. ගොඩනැගිල්ලේ නිර්මානය හා අයපත්‍රය මෙම කාර්යාලයේදී 1969 ජූලි 20 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුළදී පරීක්‍ෂා කළ හැකිය.

5. ටෙන්ඩරයට අදාළ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් කර ඇත.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
වැඩ බලන වන සත්ව භාරකාර.

1969.6.17 වන දින,
කොළඹ 1,
ඇචිලන් චතුරශ්‍රයේ,
වන සත්ව දෙපාර්තමේන්තුවේදී ය.

6–958—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## යුද්ධ හමුදා මූලස්ථානය

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලසීමාව තුල—

(අ) කොළඹ, දියතලාව, ත්‍රිකුණාමලය, පනාගොඩ, අම්පාරේ, කටුකුරුන්ද, කන්තලේ, උඩවලවේ සහ පදවිය පිහිටා ඇති යුද හමුදා කඳවුරු වලට ආරෝග්‍යශාලා සහ බැරැක්ක රෙදිපිළි හා යුද භටයින්ගේ කිලුටු රෙදි ඇපිල්ලීමේ සේවය,

(ආ) දියතලාවේ පිහිටා ඇති යුද හමුදා කඳවුරු වලට කසළ ශෝධක හා කම්කරුවන් සැපයීම,

සඳහා ටෙන්ඩර් පත් 1969 ජූලි මස 15 වෙනි දින උදේ 10 දක්වා කොළඹ, බාල දක්ෂ මාවත, යුද හමුදා මූලස්ථානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා යුද හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත ඉහත සඳහන් එක් එක් සැපයීම් පිණිස නැවත ලබාගත හැකි රු. 75 මුදලක් (චෙක්පත් භාරගනු නොලැබේ) තැන්පත් කර සිටිය යුතුය. පූර්වෝක්ත සැපයීම් පිළිබඳව ටෙන්ඩර් පත් 1969 ජූලි මස 14 වෙනි දින දහවල් 12 දක්වා යුද හමුදා මූලස්ථානය විසින් නිකුත් කරනවා ඇත. වැඩි විස්තර කොළඹ, බාලදක්ෂ මාවත, යුද හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

සී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුදා අණදෙපති.

1969 ජූනි මස 18 දින,
යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553,
කොළඹ.

6–1055—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

පහත සඳහන් කාර්යයන් සඳහා 1969 ජූලි 11 වැනිදා පෙරවරු 11.30 දක්වා මන්නාරම දිසාපති විසින් පහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(1) මඩු පල්ලියේ සංචාරක බංගලාවට අතිරේක කාමරයක් තැනීම සහ දනට ඇති බංගලාව අළුත්වැඩියා කිරීම ;
(2) කච්චේරියේ ආපන ශාලාවට අතිරේක කාමරයක් තැනීම ;
(3) මන්නාරමේ තානායම අළුත්වැඩියා කිරීම ;
(4) අරිප්පු සංචාරක බංගලාවට අමතර කොටස් එකතු කිරීම.

2. රජයේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 10 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ඊට ප්‍රථම ඉහත සඳහන් එක් එක් වැඩ කොටස සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල වක රු. 25 ක් බැගින් වෙන් වෙන් වශයෙන් දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

3. මන්නාරම දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘතිවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් විවෘත කිරීම 1969 ජූලි මස 11 වැනි දින පෙරවරු 11.35 ට මන්නාරම කච්චේරියේදී කරනු ලැබේ. මේ අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

5. එක් එක් වැඩ කොටස සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් එවිය යුතුය. ඉල්ලුම්කරන වැඩ කොටසේ නම ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ සඳහන් කොට සීල් තබා ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ මෙම කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුළුවන.

6. තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු වහාම වැඩ පටන් ගැනීමට සූදානමින් සිටිය යුතුය.

7. වැඩි විස්තර කාර්යාලයීය වේලාවන් හිදී මන්නාරම දිසාපතිගෙන් ලබාගත හැක.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 11 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේදී ය.

6–987—69.6.27 දින අංක14,860 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434රේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තැන විසින් මාම්පිටිය ග්‍රාමීය රෝහලේ ජල සම්පාදනය ඉදිකිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 ජූලි මස 23 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම්වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 ජූලි මස 11 වන සිකුරාදා පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන ඉදිකිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් පනහක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම්වලටද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකිය. සේවයේ විස්තර ද, ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට ටෙන්ඩර්කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්‍රය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබාගත නොහැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුවරත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගෙන් ලබාගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 ජූනි මස 19 වනදා,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

6–1158—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයෑම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වැනිද දක්වා (දෙදින ඇතුලුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රු. 100ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ ගාල්ල, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කලුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දි ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු, තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**— සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුර" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම මගේ ලේකම්/ගණකාධිකාරී මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරික්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු, මා විසින් නියම කරන ලද ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුලුවන

පී. රත්නසභාපති,
වැ.බ. සෞඛ්‍ය සේවා අධිකාරි තැන,
අනුරාධපුරය.

1969 ජූනි මස 17 වැනි දින,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

## උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | | (3) ප්‍රමාණය | (4) අවසාන දිනය |
|---|---|---|---|---|
| අනුරාධපුර දුම්රිය පොළේ සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය දක්වාත් එතැන් සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | අනුරාධපුර | ... | 6,500 | 24.7.69 |
| ත්‍රිකුණාමලය දුම්රිය පොළේ සිට ත්‍රිකුණාමලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලය දක්වාත් එතැන් සිට ත්‍රිකුණාමලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට | ත්‍රිකුණාමලය | ... | 6,500 | |
| කැකිරාව දුම්රිය පොලේ සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලය දක්වාත්, එතැන් සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලයාධිපති තැන යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට | කැකිරාව | ... | 3,550 | |

6–1145/1—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

1969 ඔක්තෝබර් 1 වෙනි ද සිට 1970 සැප්තැම්බර් 30 වෙනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ ටෙන්ඩර් පිළිබඳ විස්තර දක්වා ඇති පිටිකිරි සහ සීනි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාලවල සහ ගබඩාවල සිට/සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේපවත්නා කාර්යාල සහ ගබඩාවල සිට දිස්ත්‍රික් පරිපාලකවරයින්ගේ කාර්යාල සහ ගබඩාවල සිට/දුම්රිය ස්ථානවල සිට/පිටිකිරි සහ සමූපකාර සංගම්වල සිට/සීනි, කිරි මධ්‍යස්ථානවලට උපලේඛනයේ සඳහන් එක් එක් සේවය සඳහා වෙන වෙනම සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන ඡෙදයේ සඳහන් පරිදි රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනට කලින් දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය, වව්නියාව සහ ගාල්ල යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට කලින් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට කලින් තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරිනට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිටිකිරි සහ සීනි දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහා ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම්/ගණකාධිකාරි මහතාට දීමෙන් හෝ ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරන ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරණ වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ ම විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරික්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නාලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරන ලද ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡෙදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුලුවන.

පී. රත්නසභාපති,
වැ.බ. සෞඛ්‍ය සේවා අධිකාරි.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අනුරාධපුරය,
1969 ජූනි මස 17 වැනි දින.

උප ලේඛනය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>පිටිකිරි සහ සීනි ප්‍රමාණය දළ වශයෙන්<br>පිටිකිරි<br>හො. | <br><br>සීනි<br>හො. | 4<br>අවසන් දිනය සහ වේලාව |
|---|---|---|---|---|
| 1. ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ ත්‍රිකුණාමලයේ සමුපකාර සංගමයේ සිට සීනි, ත්‍රිකුණාමලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ ත්‍රිකුණාමලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | ත්‍රිකුණාමලය ... | 50 | 16 | 24.7.69 පෙ.ව. 10ට |
| 2. අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ අනුරාධපුරයේ සමුපකාර සංගමයේ සිට සීනි, අනුරාධපුරයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙනයාමට | අනුරාධපුරය ... | 36 | 13 | |
| 3. කැකිරාව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ කැකිරාව සමුපකාර සංගමයේ සිට සීනි, කැකිරාවේ සෞඛ්‍ය කාර්යාලයාධිපතිතැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයාධිපතිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | කැකිරාව ... | 30 | 11 | |
| 4. අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ කහටගස්දිගිලිය සමුපකාර සංගමයේ සිට සීනි, කහටගස්දිගිලිය සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයාධිපතිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානයට ගෙන යාමට | කහටගස්දිගිලිය ... | 10 | 3 | |

6–1145/2—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

1. **සේවය සහ ටෙන්ඩර් කරුවන්ගේ සුදුසුකම්.**—1969 ඔක්තෝබර් 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකත් ඇතුලුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමු වැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී විසින් බාර ගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර**—ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක. නියමිත ෆෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් බාරගනු නො ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ෆෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ෆෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යු තුයි. මේ සඳහා වුවමනා ෆෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑ ම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුරය" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩකෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නාලද ටෙන්ඩර් කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන් ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන් වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහාමෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත්, කළ හැක්කේ ඒ ඒ, මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

පී. රත්නසභාපති,
වැ. බ. සෞඛ්‍ය සේවා අධිකාරී, අනුරාධපුර.

1969.6.17,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | (3) ඇප තැන්පත් මුදල රු. ශ. | (4) මාසයකට අවශ්‍ය සේදීම් ගණන | (5) මසකට සෝදන සාමාන්‍ය කෑලි ගණන | (6) ටෙන්ඩර් වසන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| **රජයේ රෝහල—අනුරාධපුරය :** | | | | | |
| i කොටස—ශල්‍යාගාරය— | | | | | |
| ළමා වාට්ටුව<br>ගැබිනි මව්වරු<br>පිරිමි සහ ගැහැණු ශල්‍ය | 25 0 | 100 0 | 30 | 9,200 | |
| ii කොටස—සාමාන්‍ය වාට්ටු | 25 0 | 100 0 | 4 | 4,000 | |
| iii කොටස—ක්ෂය රෝගී වාට්ටු | 25 0 | 100 0 | 4 | 400 | |
| iv හෙදි අභ්‍යාස විද්‍යාලය අ'පුරය | 25 0 | 100 0 | 3 | 100 | |
| **රජයේ රෝහල—ත්‍රිකුණාමලය :** | | | | | පෙරවරු 10 ට |
| i කොටස—ශල්‍යාගාරය— | | | | | |
| ළමා වාට්ටුව<br>ගැබිනි මව්වරු<br>පිරිමි සහ ගැහැණු ශල්‍ය | 25 0 | 100 0 | 30 | 4,700 | |
| ii කොටස—සාමාන්‍ය වාට්ටු | 25 0 | 100 0 | 4 | 800 | |
| iii කොටස—ක්ෂය රෝග වාට්ටු | 25 0 | 100 0 | 4 | 200 | |

6–1145/3—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් සහ සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන අයුරු දුම්රිය පළවල සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ හා සෞඛ්‍ය කායසීලයාධිපතින්ගේ ගබඩාවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් වෙන වෙනම එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර්පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, වව්නියාව හෝ රත්නපුර හෝ යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම්කිරීමේදී මුදල් තැන්පත් කර ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනයේ නියමිත වේලාවට පෙර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරනු ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යායුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උප ලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, මඩකලපුව '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත ඉකලවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායසීලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද, ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

8. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැනගැනීම සඳහා දෙවන ඡේදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

ඒ. බී. එන්. මොහමඩ්,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 ජූනි මස 17 වැනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

## උපලේඛනය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>යැවිය හැකි ප්‍රමාණය | 4<br>ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| වාලච්චේන දුම්රිය ස්ථානයේ සිට වාලච්චේන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් එම කාර්යාලය යටතේ ඇති කිරි දෙන මධ්‍යස්ථාන වෙත ... ... | වාලච්චේන ... | 6,959 | ... 1969.7.24 දින පෙ.ව. 10 ට |
| මඩකලපුව දුම්රිය ස්ථානයේ සිට මඩකලපුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් කිරි දෙන මධ්‍යස්ථාන වෙත් ... ... ... ... | මඩකලපුව ... | 3,916 | ... 1969.7.24 දින පෙ.ව. 10 ට |

6–1049—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී/2/16/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඩෙක්ස්ට්‍රෝස් මොනෝහයිඩ්රේට් (මෙඩිසිනල් ග්ලූකෝස්) ආදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඩෙක්ස්ට්‍රෝස් මොනෝහයිඩ්රේට් (මෙඩිසිනල් ග්ලූකෝස්) ආදිය සැපයීම සඳහා පහත සඳහන් අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) අංක 14,843 හා 1969.2.28 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කළ වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, සෙකෝස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රූ. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, සෙලින්කෝ මන්දිරයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 සැප්තැම්බර් 5 වන දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) I වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘතකරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන් ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ, අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංගම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1969 ජූනි මස 16 වන ද.

## අදල උපලේඛනය

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 | .. Dextrose Monohydrate (Medicinal Glucose) B. P. .. | 30,000 lbs. .. | In 2 lb. tinfoil sealed lever lid tins |
| 2 | .. Potassium Citrate B.P. .. .. .. | 22,000 lbs. .. | In well closed 2 lb. bottles |
| 3 | .. Tropical Chloride of Lime B.P.C. containing not less than 30.0% of available Chlorine | 370 cwts. .. | In 56 lb. galvanised drums |
| 4 | .. Calcium Lactate B.P. 5 gr. (325 mgm.) .. .. | 12,000,000 Tablets .. | In polythene bags of 5,000 tablets inserted in lever lid tins |
| 5 | .. Paraffin Molle Flav B.P. .. .. .. | 20,000 lbs. .. | In 36 lb. tins |
| 5 (*a*) | .. Do. .. .. .. .. | 10,000 lbs. .. | In 10 lb. tins |
| 5 (*b*) | .. Do. .. .. .. .. | 10,000 lbs. .. | In 5 lb. tins |
| 6 | .. Paraffin Molle Alb. B.P. .. .. .. | 5,000 lbs. .. | In 10 lb. tins |
| 6 (*a*) | .. Do. .. .. .. .. | 2,000 lbs. .. | In 5 lb. tins |
| 7 | .. *Soluble* Asprin B.P. (tablets of Acetylsalicylic Acid Soluble B. P.) each tablet containing the following :<br>Acetylsalicylic Acid 300 mgm<br>Anhydrous Citric Acid 30 mgm<br>Calcium Carbonate 100 mgm<br>Saccharin Sodium 3 mgm | 20,000,000 Tablets .. | In screw capped airtight bottles fitted with waxed corks each bottle containing 1,000 tablets |
| 8 | .. *Soluble* Asprin for Infants B. P. C. (tablets of Acetylsalicylic Acid Soluble for infants B. P. C.) each tablet containing the following:<br>Acetylsalicylic Acid 150 mgm<br>Anhydrous Citric Acid 15 mgm<br>Calcium Carbonate 50 mgm<br>Saccharin Sodium 1½ mgm | 5,000,000 Tablets .. | do. |

6–1024—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 18 සිකුරාදා පස්වරු 2.30 වනතෙක් මෙහි පහත සඳහන් කාර්‍ය සඳහා ටෙන්ඩර් පත්‍ර මඩකලපුව අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| මඩකලපුව ර. ගු. වි. | ... | වැඩි දියුණු කිරීම. |
| අම්බාලච්චේනයි ර. ගු. වි. | ... | එම |

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්‍යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මඩකලපුව ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, 1969 ජූලි 17 වැනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෝ ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මඩකලපුවේ අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවෙනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මඩකලපුව, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය ලබා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් මඩකලපුවේ අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය) පැහැදිලිව ලියා ටෙන්ඩකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මඩකලපුව අධ්‍යාපන කාර්‍යාලයේ පාලන සහකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූලි 18 වැනි සිකුරාදා පස්වරු 2.30 ට මඩකලපුවේ අධ්‍යපාන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩරය විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර ඇතොත් මඩකලපුව, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක.

8. ටෙන්ඩර් පත් නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. සන්කරලිංගම්,
නැගෙනහිර ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969. 6. දින,
මඩකලපුව,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

6–1135—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

තනි කාණුවේ කොන්ක්‍රීට් නළ 50,000ක් සැපයීම සහ ගෙනවුත් භාරදීම සඳහා කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්‍යාලයේ ගැණුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජූලි මස 31 වෙනි දින පෙ. ව. 9.45 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් පෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේ දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමට ද, අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්‍යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ තැපැල් කාර්යාලයක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1969 ජූලි මස 26 වෙනි දින ප. ව. 4 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර් කරුවනට, ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකි වේ.

ජී. ඊ. ද ඇස්. එල්ලාවල,
වැ. බ. පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්‍යාලය,
තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ලෝටස් පාර, කොටුව,
කොළඹ.

6–1153—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අත්තනකඩවර 3බී වර්ගයේ නිවාසයක් ගොඩ නැගීම

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.7.15 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 30,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1969.7.9 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරන ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969 ජූනි මස 19 වෙනි දින,
සිවිල් ඉංජිනේරු අංශය,
අංක 457, ගාලු පාර,
කොළඹ 3.

6–1136—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා කොළඹ 1, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලයේ පිහිටි තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ගැණුම් පත් මණ්ඩලයේ සභාපති විසින් 1969 ජූලි මස 31 වෙනි දින පෙ. ව. 9.45 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

(i) පී. වී. සී. ටැලිෆෝන් ද්විත්ව සංදම (ටුවින් කේබල්ස්) යාර ලක්ෂ පහයි. (5,00,000) ;

(ii) අනාවරණ තඹ කම්බි 3/20 (පොළවේ වළලන) රාත්තල් දෙදහසක් (2,000) ;

(iii) මාර්ග තුන සහිත පහසුවෙන් කැවෙන පොලිතීන්වලින් ආවරණය කරන ලද වී. ඒ. සී. 230 සැපයීම් බෙදා හැරීම සඳහා සහ ඒ. ඇම්. පී. 5 (23/0076) විදුලි බල වේගය ගෙන යාහැකි කම්බි යාර පන්දහසක් (5,000).

2. කොළඹ 1, කොටුව, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝරම්වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීමටද, අවශ්‍ය විස්තර දැනගැනීමටද පුළුවන.

3. කොළඹ 1, මධ්‍යම විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ තැපැල් කාර්යාලයක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1969 ජූලි මස 26 වෙනි දින ප. ව. 4 වන තෙක් බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගත හැකි වේ.

ජී. ඊ. ද ඇස්. එල්ලාවල,
වැ. බ. පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලි සංදේශ
අධ්‍යක්ෂ කාර්යාලය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ලෝටස් පාර, කොටුව,
කොළඹ 1.

6–1150—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශයේ ජලසම්පාදනය, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය, රත්මලාන

### ගාල්ල ජලසම්පාදන ක්‍රමය (වෘද්ධිය) 1 වන පියවර—විකල්ප ටෙන්ඩරය

ගැලුම් දසලක්ෂ $1\frac{1}{2}$ ක් අල්ලනු ලබන වටකුරු පෙරදඩිකරන ලද කොන්ක්‍රීට් සේව ජලාශයක් සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම හා එයට සම්බන්ධ වැඩ හා ජලාශ ස්ථානයට ප්‍රවේශය වීමේ මාර්ගයක් නිර්මාණය කිරීමෙන් ද, සමන්විත වනු ලබන ගාල්ලේ ජලසම්පාදන ක්‍රමයේ වෘද්ධිය සඳහා විකල්ප ටෙන්ඩර් කැඳවනු ලැබේ.

කොළඹ 1, යෝර්ක් වීදිය, ජේමාස් ගොඩනැගිල්ලේ 1 වෙනි මහලේ 75 1/1, පළාත් පාලන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1969 අගෝස්තු මස 30 වන සෙනසුරාදා පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන එදිනම පස්වරු 2.35ට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

2. ටෙන්ඩර් මෙම අංශයේ ප්‍රධාන ඉංජිනේරු (නිර්මාණ) තැන ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙපිටපතකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. විස්තර හා තොරතුරු ඉහත කී ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැකිවන අතර, මෙයට අදාළ සැලසුම් ද ඔහුගේ කාර්යාලයේදී ලබාගත හැකි වන්නේ ය.

3. වර්ෂ 1969 ජූලි මස 25 වන සිකුරාදා දහවල් 12 ට හෝ ඊට පෙරාතුව, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් දෙසිය පණහක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් මෙම කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

4. පහත සඳහන් වර්ගයට අයත් කොන්ත්‍රාත්කරුවන් පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සන් වන්නේ ය:—

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ "ඒ" කාණ්ඩයේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ;

(ආ) "ඒ" කාණ්ඩයේ කොන්ත්‍රාත්කරුවන්ට සමාන තත්ත්වයේ සිටින විදේශීය හා දේශීය කොන්ත්‍රාත්කරුවන්.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කරන විට මේ හා සමාන වෙනත් වැඩ කර ඇති බවට හා යෝජිත වැඩය භාරගැනීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ඇති නිලධාරීන් තමන්ගේ කාර්ය මණ්ඩලයේ සිටින බවටත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් අකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය වනතෙක් නොසිට, හැකි පමණ ඉක්මණින් ඒවා ලබාගන්නා ලෙස ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
වැඩබලන අධ්‍යක්ෂ,
ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය.

පළාත් පාලන අමාත්‍යාංශයේ
ජලසම්පාදන, ජලාපවහන හා පළාත් පාලන වැඩ අංශය,
රත්මලාන.

6–1134—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 18 වැනි දින පෙරවරු 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩෙහි ස්වභාවය |
|---|---|---|
| 1. කු/කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලය | ... | I. ගැලුම් 2,000 වතුර ටැංකිය. II. ජලයන්ත්‍ර කාමරය. III. ජලය සැපයීම හා බෙදාහැරීම |
| 2. කු/මගුලාගම ම. වි. | ... | පාසල් ගොඩනැගිල්ල. |
| 3. කු/වදාකඩ ම. වි. | ... | විද්‍යාගාරය. |
| 4. කු/දිගල්ල ම. වි. | ... | ගුරු නිවාසය. |
| 5. කු/ගජනැක් ගම වි. | ... | පාසල් ගොඩනැගිල්ල. |
| 6. කු/කුරුණෑගල කණිෂ්ඨ තාක්ෂණික වි. | ... | වැඩිදියුණුව. |
| 7. කු/වැවල වි. | ... | පාසල් ගොඩනැගිල්ල. |
| 8. කු/මහව ම. ම. වි. | ... | වාණිජ විද්‍යාගාරය |
| 9. කු/ගල්ගමුව මූ. වි. | ... | පාසල් ගොඩනැගිල්ල. |
| 10. කු/අනුක්කනේ වි. | ... | පාසල් ගොඩනැගිල්ල. |
| 11. කු/මසිලැව වි. | ... | ගුරු නිවාසය. |
| 12. කු/මලියදේව බා. ම. වි. | ... | පාසල් ගොඩනැගිල්ල. |
| 13. කු/කුලියාපිටිය කණිෂ්ඨ විශ්ව විද්‍යාලය | ... | කම්බි වැට. |

සංලක්ෂ්‍යය.—කු = කුරුණෑගල දිස්ත්‍රික්කය.

කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 35,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 2 සිට 3 දක්වා රු. 30,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 4 සිට 6 දක්වා රු. 25,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 7 සිට 11 දක්වා රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට, අංක 12 සිට 13 දක්වා රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 17 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද

ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එව්ය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහු ගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එව්ය යුතුය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් පුද්ගලිකව කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ පාලන සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාර ගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1969 ජූලි මස 18 වැනි දා පෙරවරු 10.30ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
කුරුණෑගල ප්‍රදේශයේ වැඩබලන
අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජූනි මස 19 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

6–1144—69.6.27 දින අංක14,860 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 18 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| විද්‍යාලයේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, කොළඹ 2. ... | ගොඩනැගිලි නඩත්තුව සහ සුළු වැඩිදියුණු කිරීම්. |
| 2. කො/කලපළුවාව ශ්‍රී සිද්ධාර්ථ මහා විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ. |
| 3. කො/පන්නිපිටිය ධර්මපාල මහා විද්‍යාලය ... | අළුත් වැඩියාව. |
| 4. කො/බිලුමැන්ඩල් විද්‍යාලය ... | වහල අළුත් වැඩියාව. |
| 5. කො/රාජගිරිය හේවාවිතාරණ කණිෂ්ඨ විද්‍යාලය ... | වැසිකිලි තැනීම සහ ජල සේවය. |
| 6. කො/පිටිපන මහා විද්‍යාලය ... | වහල නැවත තැනීම. |
| 7. කො/වැල්ලවත්ත ලංකා සභා දෙමළ විද්‍යාලය ... | අළුත් වැඩියාව. |
| 8. කො/මාදම්පිටිය ශාන්ත අන්තෝනි දෙමළ විද්‍යාලය ... | අළුත් වැඩියාව. |

**සංලක්ෂය.**—කො = කොළඹ ප්‍රදේශය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ විදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ, වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 31,000, අංක 2 රු. 20,000, අංක 3 රු. 15,000, අංක 4 සිට 8 දක්වා රු. 6,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 17 වැනි බ්‍රහස්පතින් දා පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෝ ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිති වලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එව්ය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපෑලෙන් ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එව්ය යුතුය. තැපෑලෙන් නොඑවන පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ග්‍රීන්පාත්, කොළඹ 7 අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 ජූලි 18 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි. ,

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

5. 1969 ජූලි 18 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ග්‍රීන්පාත්, කොළඹ දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

වී. ජී. බී. මුණසිංහ,
අධ්‍යාපනාධ්‍යක්ෂ—කොළඹ ප්‍රදේශය.

1969 ජූනි මස 19 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

6–1141—69.6.27 දින අංක 14,860 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 ජූලි මස 19 වැනි සෙනසුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| ර/උඩගම මහා විද්‍යාලය ... | විද්‍යා රසායනාගාරයේ ඉතිරි වැඩ |

සංලක්‍ෂය.—ර=රත්නපුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල් වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 ජූලි මස 18 වැනි සිකුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුසෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාරදීමේදී කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්‍ෂි ඉදිරිපත් කරන අයට පමණි.

අවශ්‍ය ලියාපදිංචි : රු. 55,000.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද මේ වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීමෙන් නිදහස් ය. ඔවුන් දෙවන ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්‍ෂි ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපනාධ්‍යක්‍ෂගෙන් ලබා ගත් ටෙන්ඩර්පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය පිළිබඳ විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා, ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාඨශාලා ගොඩනැගිලි ශාඛාවේ ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1969 ජූලි මස 19 දා පෙ. ව. 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වනතුරු තමන් සඳහන් කරන මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. ටෙන්ඩර් ලියවිලි පරීක්‍ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයෙන් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1969 ජූනි මස 19 දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

6–1075—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

3

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## ටැන්ඩර් ප්‍රතිඵල

රීල් වශයෙන් යුත් ක්‍රාෆ්ට් කඩදාසි දිග ටොන් 400 සැපයීම සඳහා කැඳවන ලද 1969.2.14 දින අවසන් කළ ටැන්ඩර්යේ ප්‍රතිඵල පහත දැක්වේ :—

| ප්‍රමාණය | ටැන්ඩර් කරු | නිෂ්පාදිත රට | මිළ |
|---|---|---|---|
| දිග ටොන් 200 ... | ස්විඩනය, බ්‍රික් [illegible]ක්මාර්ස් ... | ... ස්විඩනය ... | කොළඹට ; දිග ටොන් 1ක් ආ.මි.වා. මිළ අමෙරිකානු ඩොලර් 193.63 |
| දිග ටොන් 200 ... | ඒකාබද්ධ රාජ[illegible] එෆ්ජ්. ඊ. එක්ස්පෝර්ට් ලිමිටඩ්. .. | ස්[illegible]නය ... | කොළඹට; දිග ටොන් 1ක් ආ.මි.වා. මිල ප. 80 සි. 13 පැ. 7 |

ලැබුනු සම්පූර්ණ ටෙන්ඩර් සංඛ්‍යාව 19 යි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

135, යූනියන් පෙදෙස, කොළඹ 2,
1969 මැයි මස 27 ද.

6–1019—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## ධීවර දෙපාර්තමේන්තුව

### ඇන්ජින් සහිත වූ/රහිත වූ/පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා වෙන්දේසියේ විකිණීම

ඇන්ජින් සහිත වූ/රහිත වූ ටොන් 3½ රේ පාවිච්චි කරන ලද ධීවර යාත්‍රා පහත සඳහන් උප ලේඛනයෙහි දැක්වෙන දිනයන්හි දී සහ ස්ථානයන් හි දී පෙ. ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උප ලේඛනයෙහි සඳහන් ස්ථානයේදි මෙම යාත්‍රා පරීක්ෂාකර බැලිය හැකිය. ගෙවීම් පහත සඳහන් පරිදි මුදලින් ම කළ යුතුය.

(අ) යාත්‍රාවේ විකුණුම් මිළෙන් ¼ක් විකිණීම අවසන් වූ වහාම.

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3ක් ඇතුළත දී.

වෙන්දේසියේ විකුණන ලද යාත්‍රා මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යනතෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමි භාග යෙහි තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ඩීසී. 4 | — | වැල්වෙට්ටිතුරේ වෙරළ (කොටටියාර්) | 1969.7.30 |
| විජේ. 16 | — | වාඩිය පටුමහ, වැල්වෙට්ටිතුරේ | 1969.7.30 |
| ජීජ්පී. 7 | පර්කින්ස් | වීකේඑස් යාත්‍රාංගනය, වැල්වෙට්ටිතුරේ | 1969.7.31 |
| එන්එල්. 47 | බුක් | එම | 1969.7.31 |
| ඩීසී. 9 | ලිස්ටර් එච් ඒ 3 | තොන්ඩමන්නාරම පාලම අසල | 1969.8.1 |
| ඩබ්ලිව්. 22 | — | වාලච්චනේ | 1969.8.2 |
| ටී. 53 | අ. බ. 8 යන්මාර් | රා. ලං. නාවික භූමිභාගය, ත්‍රිකුණාමලය | 1969.8.3 |
| ටීඑස්. 10 | අ. බ. 11 ඩයියා | එම | 1969.8.3 |
| එම්සී. 104 | අ. බ. 30 පර්කින්ස් | එම | 1969.8.3 |
| ටීඑස්. 74 | අ. බ. 30 පර්කින්ස් | එම | 1969.8.3 |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 ජූනි මස 20 වෙනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

6–1022—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින් වෙන්දේසියේ විකිණීම

පාවිච්චි කරන ලද නාවික ඩීසල් එන්ජින්, වෙන්දේසියේ විකිණීම පහත සඳහන් උපලේඛනයේ දක්වෙන ස්ථානවලදී සහ දිනවලදී පෙ. ව. 9.30 ට සිදු කරනු ලැබේ:—

2. උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි දී මෙම එන්ජින් පරීක්ෂා කර බැලිය හැකිය.

3. ගෙවීම් පහත දක්වෙන පරිදි මුදලින් ම කළ යුතුය :—

(අ) ඇන්ජිමේ විකුණුම් මිළෙන් ¼ක් විකිණීම අවසන් වූ වහාම.

(ආ) විකුණුම් මිළෙන් ඉතිරි ¾ කොටස දින 3ක් ඇතුළත දී.

4. වෙන්දේසියේ විකුණන ලද එන්ජින් මුදල් ගෙවීමෙන් පසු ඉවත් කරගෙන යනතෙක් ජයග්‍රාහී ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ වගකීම මත එම භූමිභාගයෙහි ම තිබෙන්නට හරිනු ලැබේ.

### උපලේඛනය

| යාත්‍රා අංකය | ඇන්ජිමේ වර්ගය | තිබෙන ස්ථානය | වෙන්දේසි කරන දිනය |
|---|---|---|---|
| ටී. 331 | අ. බ. 16 පෙටර් | කවුනේරිය, ධීවර කාර්යාලය | |
| එජ්. 20 | පාර්සන්ස් සිලි. 2 | එම | |
| ජේපීඑජ්. 48 | අ. බ. 17 කුබෝටා | එම | 69. 8. 4 |
| එස්අයිසී. 20 | ඇලිසා ග්‍රෙග් | එම | |
| ඩබ්ලිව්. 26 | ටෝර්පිඩෝ | එම | |
| ටී. 150 | බුක් | ප්‍රාදේශීය ධීවර කාර්යාලය, මීගමුව | |
| ටී. 230 | කුබෝටා | එම | |
| — | ලිස්ටර් එච් ඒ. 2 (අංකය 607 එච්ඒ2 එම 10) | එම | |
| එස්. 175 | ඇලිසා ග්‍රෙග් | එම | |
| ටී. 133 | බුක් | එම | |
| ටී. 222 | බුක් | එම | |
| ටී. 106 | බුක් | එම | 69. 8. 6 |
| එස්. 66 | පාර්සන්ස් | එම | |
| ටී. 148 | ඩියුට්ස් | එම | |
| ටී. 115 | අ. බ. 12¾ ලිස්ටර් | එම | |
| ටී. 88 | ඩියුට්ස් | එම | |
| එස්. 4 | ඩියුට්ස් | එම | |
| ටී. 159 | ලිස්ටර් | එම | |
| ටී. 116 | අ. බ. 12¾ ලිස්ටර් | එම | |
| ටීඑස්. 23 | පර්කින්ස් | ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය, මීගමුව | |
| එන්එල්. 10 | පර්කින්ස් | එම | |
| — | අ. බ. 18 යන්මාර් (අංකය 3347) | එම | 69. 8. 7 |
| — | අ. බ. 8 යන්මාර් | එම | |

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

1969 ජූනි මස 20 වෙනි දින,
කොළඹ, ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

6–1023—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### වෙන් දේ සියේ විකිණීමයි

රාජ්‍ය දැව සංස්ථාවේ වවුනියා දැව ගබඩා භූමියේ ඇති ඝන අඩි 4,967.2 ක ප්‍රමාණයේ පළමුවන, දෙවන හා තුන්වන පංතියට අයත් කඳන් තොගයක් එම භූමියේදී, බිලය ලත් නිලධාරි තැන, උතුරු ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකාර තැන විසින් 1969 ජූලි මස 10 වෙනි දින පෙරවරු 10 ට වෙන් දේ සියේ විකුණනු ලැබේ.

2. වෙන් දේ සියේ දී දැව ඉල් ලීමට බලාපොරොත් තු වන අය, කරුණාකර පැමිණ එම දැව වර්ග පරීක් ෂා කර බලා සෑහීමට පත් වනු මැනවි.

ප්‍රාදේ ශීය කළමනාකරු, උ. ප්‍ර.,
යාපනය.

රාජ්‍ය දැව සංස් ථාව,
අංක 8, නුවර පාර, යාපනය.

6–1122—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ චාමස් තටාකයේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ජූලි මස 4 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ජූලි මස 3 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඩී/විකිණීම්/5
1969 ජූනි මස 20 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. පැතලි යකඩ කෑලි මිටි 25 යි.
2. බෙයාරිං ප්ලේට්ස් මිටි 3,625 යි.
3. අතුගා එකතු කළ සිමෙන්ති ගෝනි 27 යි.
4. අතුගා එකතු කළ කලවන් පෝර ගෝනි 75 යි.

6–1146—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම

ඉතා හොඳ තත්ත්වයේ ඇති, පාවිච්චි කරන ලද වාහන 12 ක් පමණ 1969.7.11 වෙනි සිකුරාදා පෙරවරු 10 ට කොළඹ 2, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වාහන ඉහත සඳහන් ස්ථානයේදී කාර්යාලයීය වේලාවන් හිදී පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ගබඩා අධිකාරීගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ජූනි මස 27 වෙනි දින,
කොළඹදීය.

6–1196—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද වෙන්දේසිය —1969.10.1 සිට 1970.9.30

සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් දනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි හා 1969 ජූනි මස 6 දින අංක 14,857 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද විශේෂ කොන්දේසිවලට යටත්ව, 1969 ඔක්තෝබර් මස 1 දින සිට 1970 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උප ලේඛණයේ වූ තැබෑරුම්වල අරක්කු සිල්ලරට තනි අයිතිය මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් මෙයින් කැඳවනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම එක් එක් තැබෑරුම වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් වශයෙන් රු. 2,000 ක් ගෙවීමෙන් පසු ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක පිළියෙළකළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම එසේ ගෙවීම් කරනු ලැබීමෙන් ලබා ගත් කච්චේරි කුවිතාන්සියක් සහ ටෙන්ඩර් කරුගේ දේපොල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශිය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයක්ද අමුණා එවිය යුතුය. පසුගිය වර්ෂයේ ටෙන්ඩර් සඳහා ඉදිරිපත් කරන ලද වත්කම් සහතිකයම ඉදිරිපත් කෙරේ නම් එකිනෙක තැබෑරුම සඳහා ටෙන්ඩර් කරන ලද මුළු මුදලින් 25% ට අඩු නොවන වත්කම් සහතිකය සමඟ බැඳීම් සහතිකයක්ද ඇමිණිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ත්‍රිකුණාමලයේ දිසාපති වෙතය. සෑම ටෙන්ඩරයක්ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස උඩ කෙළවරේ '' අංක .............. දරණ අරක්කු තැබෑරුම සඳහා ටෙන්ඩරය '' යනුවෙන් සඳහන් කළ යුතුය. සීල් තබන ලද ටෙන්ඩර් සහිත කවරය (අ) මෙම කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් හෝ මෙහි පහත දක්වෙන ටෙන්ඩර් භාර ගැනීමෙන් අවසාන වේලාවට පෙර දිසාපති තුමා වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

4. කිසිම තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩරයකට වඩා එවීමට කිසිම පුද්ගලයෙකුට අවසර නොමැත. විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් ආකාරයකින් නිසි ලෙස සකස් නොවූ ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. 1969 ජූලි මස 25 වැනි දින ටෙන්ඩර් පත් වසනු ලැබේ.

6. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් පැමිණී සිටිය යුතුය. සාර්ථක ලෙස ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කළ ටෙන්ඩර්කරු විකිණීමේ අයිතිය ඔහු සතු බව ප්‍රකාශයට පත් කළ වහාම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා, විකිණීමේ කොන්දේසි නිසි ලෙස ඉටු කිරීමේ ඇප තැන්පත් මුදල වශයෙන් දෙමසක රේන්ද කුලියට වැඩි මුදලක් ත්‍රිකුණාමලය දිසාපති වෙත ගෙවිය යුතුය.

7. යම් ටෙන්ඩර්කරුවෙක්ම, ඔහුට වරප්‍රසාද හිමිවූ බවට ප්‍රකාශ කරනු ලැබුවායින් පසුව විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට හෝ තැන්පත් මුදල ගෙවීමට ප්‍රතික්ෂේප කළොත් එය ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල ඔහුට අහිමි වනවාත් හැර, සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් කොන්දේසි කඩකරන ටෙන්ඩර්කරුවන්ගේ නාම ලැයිස්තුවට ඔහුගේ නම ඇතුළත් කිරීමට හේතු වනවා ඇත. සාර්ථක ටෙන්ඩර්කරු විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව මේ විශේෂත්වයට යටත්ව, සෙසු සියළු ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

8. හේතුන් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලමත් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තුමා වෙත පැවරී ඇත.

9. වැඩි විස්තර ත්‍රිකුණාමලය කච්චේරියෙන් ලබා ගත හැක.

10. මීළඟ රේන්ද කාලය තුළදී දනට තැබෑරුම් පවතින ස්ථානම—විශේෂයෙන් අංක 1, 2 සහ අංක 4 දරණ තැබෑරුම්ම පාවිච්චිය සඳහා ප්‍රයෝජනයට ගත හැකි වේයයි සහතික කළ නොහැක.

11. 1969–70 වර්ෂය සඳහා අනුමත අරක්කු තැබෑරුම් ලැයිස්තුවට සහ ඉහත සඳහන් කළ උපලේඛනයද පහත සඳහන් අයුරු වේ :—

| තැබෑරුමේ අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව | වසන වේලාව |
|---|---|---|---|---|
| 1. | නගර සභාව, ත්‍රිකුණාමලය ... | කොට්ඨාශය අංක 1 ත්‍රිකුණාමලය නගර සභාව ... | පෙ.ව. 8.00 ... | ප.ව. 8.00 |
| 2. | එම ... | කොට්ඨාශ අංක 5 ත්‍රිකුණාමලය නගර සභාව ... | පෙ.ව. 8.00 ... | ප.ව. 8.00 |
| 3. | එම ... | කොට්ඨාශ අංක 9 ත්‍රිකුණාමලය නගර සභාව ... | පෙ.ව. 8.00 ... | ප.ව. 8.00 |
| 4. | නිලාවෙලි ගම්සභාව ... ... | නිලාවෙලි ... ... ... | පෙ.ව. 8.00 ... | ප.ව. 6.30 |

12. ටෙන්ඩර් වසන වේලාවන් පහත දක්වෙන අයුරුය :—

| තැබෑරුමේ අංකය | ටෙන්ඩරය වසන වේලාව |
|---|---|
| 1 ... | පෙ.ව. 10.00 |
| 2 ... | පෙ.ව. 10.30 |
| 3 ... | පෙ.ව. 11.00 |
| 4 ... | පෙ.ව. 11.30 |

සෙල්ලයියා සිවඥානම්,
සහකාර දිසාපති,
ත්‍රිකුණාමලය දිසාපති වෙනුවට.

1969 ජූනි මස 17 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දීය.

6–1044—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## 1969/70 වර්ෂයට අනුරාධපුර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වෙනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුල පහත දක්වෙන තැබෑරුමේ අරක්කු සිල්ලරට විකිණීම සඳහා ටැන්ඩර් පත්‍ර පහත දක්වෙන කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ :—

(i) 6.6.69 වැනි දින අංක 14,857 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි සහ :—

(ii) සියළුම සුරාබදු නීති යටතේ දනට බලපවත්නා සාමාන්‍ය කොන්දේසි.

2. මෙම කච්චේරියෙන් හෝ වෙනයම් කච්චේරියකින් ලබාගන්නා ලද ටැන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටැන්ඩර්පතක්ම රු. 2,500 ක මුදලක් ගෙවූ බවට භාණ්ඩාගාරයෙන් හෝ කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කල යුතුයි.

3. සාර්ථකවූ ටැන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටැන්ඩර් පත්‍ර සමඟ ඔවුන්ට අයත් නිශ්චල දේපලවල වටිනාකම් සහතිකයක් ප්‍රදේශයේ ආදයම් පාලක නිලධාරිතැනගෙන් ලබාගෙන ඇමිණිය යුතුයි. එක් තැබෑරුමකට ඉල්ලුම් කරන ටැන්ඩර් මුදලේ වටිනාකමෙන් සියයට 25 කට අඩුවිය යුතු සහතික යක් නොවිය යුතුය. මෙම ඡේදයේ සඳහන් වන සහතිකයට අදල නිශ්චල දේපල මෙකී රේන්ද කාලය තුලදී විකිණීම හෝ පැවරීම තහනම් වන්නේය. මෙය කඩකරන අයගේ ගිවිසුම අවලංගු වූවාක්සේ සලකනු ලබත්.

4. සෑම ටැන්ඩර්පතක්ම සීල් තබන ලද කවරයක බහා එහි උඩ වම්පස කෙලවරේ "(1969/70) වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කර 1969 අගෝස්තු 13 වැනි දින පෙරවරු 10 ට ප්‍රථමයෙන් ලැබීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙත එවිය යුතුයි. ටැන්ඩර්පත්‍ර තැපෑලෙන් එවන ලද්දේනම්, ඒවා ලියාපදිංචි කල තැපෑලෙන් හා ඉහත සඳහන් පරිදි විය යුතුයි. ඉහත සඳහන් දිනයේ නියමිත වේලාවට ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාවට සියළුම ටැන්ඩර් කරුවන් පැමින සිටිය යුතුයි.

5. සාර්ථකවූ ටැන්ඩර්කරුට ඔහුගේ ටැන්ඩර් පත්‍රය පිළිගත්බව දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන්කර, දිසාපති තැන විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරන ලද මුදල් ගෙවිය යුතුයි.

6. සාර්ථකවූ ටැන්ඩර්කරුට ඔහුගේ ටැන්ඩර්පත්‍රය පිළිගත් බව දන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන් කිරීම හෝ නියමකල ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියොත්, ඔහු විසින් තැන්පත් කරන ලද ටැන්ඩර් තැන්පත් මුදල අහිමිවූ බව ප්‍රකාශ කරනවාත් හැර එසේ පැහැර හරින්නාගේ නම සියලුම සුරාබදු බලපත්‍රවලට අදල පැහැරහරින්නන්ගේ නාමලේඛනයට ඇතුලත් කරනු ලැබේ. ජයග්‍රාහක ටැන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසුව සියලුම ටැන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

7. ටැන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටැන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති වෙත පැවරී ඇත.

8. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දක්වේ :—

| අනුක්‍රමික අංකය | කෝට්ඨාශය | | තැබෑරුම පිහිටවිය යුතු ප්‍රාදේශීය කොටස | තැබෑරුම විවෘත කරන වේලාව | | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|---|---|
| 1. | අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය | ... | අනුරාධපුර නවනගරයේ පළමුවන පියවර සීමාවතුල (මාර්කට් පෙදෙස) | පෙ.ව. 8.00 | ... | ප.ව. 7.00 |

9. තනි බලපත්‍රයලත් තැනැත්තා විසින් දනට අරක්කු තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කුලියට ගතයුතුවාත් හැර, දිසාපති තැනගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනයම් ස්ථානයක විවෘත නොකල යුතු අතර, එසේ කිරීමට ලබාගතයුතු වරප්‍රසාදය දින 14 කට පෙර දිසාපති තැනගෙන් ලබාගත යුතුය.

10. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර අනුරාධපුර කච්චේරියෙන් ලබාගත හැක.

අයිවන් සමරවික්‍රම,
අනුරාධපුර (දිස්ත්‍රික්කයේ) දිසාපති.

දිසාපති කාර්යාලය,
අනුරාධපුරය, 1969.6.18.

6–1043—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## 1969/70 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අරුක්කු තැබෑරුම් රේන්ද විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ අරක්කු සිල්ලරට විකිණීම සඳහා 1969 මැයි මස 6 වැනි දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන අරක්කු තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

2. ටෙන්ඩර් ඇප වශයෙන් මෙහි පහත දක්වෙන තැබෑරුම් ලැයිස්තුවේ (ඇ) තීරයේ සඳහන් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබා ගත් නියමිත ටෙන්ඩර් පෝරමයක ඉදිරිපත් කළ යුතුයි.

3. (I) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරී තැනගෙන් ලබා ගත් වත්කම් සහතිකයක්, ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුනා තිබිය යුතුය. එම වත්කම් සහතිකයේ වටිනාකම ඔවුන් විසින් එක් එක් තැබෑරුමකට ඉදිරිපත් කරනු ලබන මුදලේ වටිනාකමෙන් සියයට 25 ට වඩා අඩු නොවිය යුතුයි.

(II) එක් තැබෑරුමකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන විට වත්කම් සහතිකයේ මුල් පිටපත හෝ විධිමත් ලෙස සහතික කරන ලද පිට පතක් හෝ එක් එක් ටෙන්ඩරයකට අමුනා එවිය යුතුයි.

(III) කොන්ත්‍රාත්තුව දීම සඳහා තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති වත්කම් සහතිකයේ දක්වෙන දේපල විකිණීම හෝ වෙන අන්දමකින් පැවරීම කොන්ත්‍රාත්තුව දීමේ ගිවිසුම කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

4. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ම ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයෙකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1969 ජූනි මස 6 වන දින අංක 14,857 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969/70 අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අංක 6 යටතේ නුසුදුසු හෝ අයගෙන් ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. එක තැබෑරුමක් වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර, පස් දෙනෙකුට වඩා හවුල්ව ද, ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සිල් තබා කවරය වම් පස මුදුනේ " කළුතර දිස්ත්‍රික්කයේ අංක..............දරණ අරක්කු තැබෑරුම් රේන්දය සඳහා ටෙන්ඩරය—1969/70 " යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය.

ටෙන්ඩර් සහිත කවර :—

(අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ,

(ආ) ලියාපදිංචි කැරුණු තැපෑලෙන් එවීමෙන් හෝ, 1969 ජූලි මස 29 වැනි දින පහත දක්වෙන උපලේඛනයේ (ඇ) තීරුවේ සඳහන් ටෙන්ඩර් නවත්වන වේලාවට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයි. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුයි.

මෙහි 4 වන ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සෙකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත්, ඊට උචමනා ලියවිලිද රැගෙන පැමිණිය යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර පිළිගත් බවට දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසි වලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ, ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත. විකිණීමේ කොන්දේසි වලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර් පත්‍රිකා භාර ගනු නොලැබේ.

9. 1969/70 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කළහොත් ඒ සම්බන්ධව කළුතර දිසාපති තැනගේ අනුමැතිය ලබාගත යුතුය.

වැඩි විස්තර කළුතර කච්චේරියෙන් ලබා හත හැක.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1969 ජූනි මස 19 වැනි දින,
කළුතර, දිසාපකි කාර්යාලයේ දීය.

### 1969/70 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද අරක්කු තැබෑරුම් ලැයිස්තුව

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටා ඇති ප්‍රාදේශීය ප්‍රදේශය | (අ) තැබෑරුම් විවෘත කරන වේලාව පෙ.ව. | (ආ) තැබෑරුම් වසන වේලාව ප.ව. | (ඇ) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (ඈ) ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව පෙ.ව. |
|---|---|---|---|---|---|---|
| 1 | කළුතර තොටමුණ ... | කලමුල්ල ගම් සීමාව තුල ... ... | 8.00 ... | 7.30 ... | 1,500 ... | 10.00 |
| 2 | කළුතර තොටමුණ ... | දියලගොඩ ගම් සීමාව තුල ... ... | 8.00 ... | 7.30 ... | 1,500 ... | 10.30 |
| 3 | බේරුවල පලාත් ආණ්ඩුසභාවේ අංක 1 දරණ කොට්ඨාශය තුල | බේරුවල පලාත් ආණ්ඩු සීමාවේ අංක 1 දරණ කොට්ඨාශය තුල | 8.00 ... | 7.30 ... | 1,500 ... | 11.00 |
| 4 | පානදුර තොටමුණ ... | පානදුර පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 8 දරණ කොට්ඨාශය තුල (වලපල පට්ටිය) | 8.00 ... | 8.00 ... | 2,000 ... | 11.30 |
| 5 | පානදුර තොටමුණ ... | පානදුර පලාත් ආණ්ඩු සභා සීමාවේ අංක 6 දරණ කොට්ඨාශය තුල (නල්ලූරුව) | 8.00 ... | 8.00 ... | 2,000 ... | දහවල් 12.00 |

6–1053—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

## පුත්තලම දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් තැබෑරුම් වල (ධාන්‍ය මත්පැන් ඇතුළුව) විදේශීය මත්පැන් විකිණීමේ අයිතිය සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට සුරාබදු බලපත්‍රයන්ට අදළ පොදු කොන්දේසි මාලාවට යටත්ව 1969–70 කාලය සඳහා අංක 14,857 හා 1969 ජූනි මස 6 වෙනි දින ප්‍රකාශයට පත් රජයේ ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

2. පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර '' 1969–70 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ විදේශීය මත්පැන් රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරයයි '' සඳහන් කර මෙහි පහත සඳහන් දිනයන්හිදී සහ වේලාවන් තුළදී එවිය යුතුය:—

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතුය. තවද එම ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන අය විසින්ම පුරවා සම්පූර්ණ කළ යුතුය. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලාංකිකයන් වූ පුර වැසියන්ගෙන් පමණකි.

4. එක් එක් තැබෑරුමක් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතු අතර, එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රිකාවකට වඩා කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතුය.

5. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 500 කට කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

6. වටිනාකමේ සහතිකයක් ද සෑම ටෙන්ඩර් පත්‍රයක් සමගම ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර්කරුවන් වටිනාකමේ සහතික ඉදිරිපත් කිරීමේදී එම සහතික ඉහත සඳහන් විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් නියමයන්ට අනුව විය යුතුයි.

7. ටෙන්ඩර් පත්‍රිකාවකට අදළ තැබෑරුම් නම හා අංක ලියුම් කවරයක වම් කෙළවරේ පැහැදිලිව ලියා ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තබා නියමිත ස්ථානයේදී නියමිත දිනයේදී හා වේලාවේදී කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත්වීමට කලින් කච්චේරියට ලැබෙන පරිදි රජයේ දිසාපති නමට ලිපිනය ලියා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තැන සතුය.

9. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා දිසාපති තුමා විසින් නියම කරන ලද ඇප තැන්පත් මුදලක් දිසාපති තැනට ගෙවිය යුතුය.

10. සුරාබදු කොමසාරිස් තුමා විසින් අංක 14,857 සහ 1969.6.6 වෙනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ 1969–70 වර්ෂය සඳහා පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් වගන්තීන් සැළකිලිමත්ව කියවා බලා ඒ අනුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන ලෙස දන්වමි. වෙනත් විස්තර අයදුම් පත් මගින් පුත්තලමේ දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලමේ දිසාපති.

1969 ජූනි මස 17 වෙනි දින,
පුත්තලම, දිසාපති කාර්යාලය.

### උපලේඛනය

| අනු අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා දිනය හා අවසාන වේලාවන් |
|---|---|---|---|
| 1. | හලාවත පළාත් ආණ්ඩු සභාව ... | ...හලාවත පළාත් ආණ්ඩු සභාවේ අංක 7 —පිටිපන වීදිය ... | 1969.8.10 පෙරවරු 9.30 |
| 2. | හලාවත පළාත් ආණ්ඩු සභාව ... | ...හලාවත පළාත් ආණ්ඩු සභාවේ අංක 6 —කඩ වීදිය ... | 1969.8.10 පෙරවරු 9.45 |

6–1045/1—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## පුත්තලම් දිස්ත්‍රික්කයේ 1969–70 වර්ෂයේ අරක්කු තැබෑරුම් විකිණීම

1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාලය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරයෙන් විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට සුරාබදු බලපත්‍රයන්ට අදළ පොදු කොන් දේසි මාලාවට යටත්ව 1969–70 කාලය සඳහා අංක 14,857 හා 1969 ජූනි මස 6 වෙනි දින ප්‍රකාශයට පත් රජයේ ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

2. පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර " 1969–70 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ අංක්කු රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩර යයි " සඳහන් කර මෙහි පහත සඳහන් දිනයන්හිදී සහ වේලාවන් තුළදී එවිය යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතුය. තවද එම ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන අය විසින්ම පුරවා සම්පූර්ණ කළ යුතුය. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලාංකිකයන් වූ පුර වැසියන්ගෙන් පමණකි.

4. එක් එක් තැබෑරුමක් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර, එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රිකාවකට වඩා කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකළ යුතුය.

5. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 500 කට කච්චේරි කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

6. වටිනාකමේ සහතිකයක් ද සෑම ටෙන්ඩර් පත්‍රයක් සමගම ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර්කරුවන් වටිනාකමේ සහතික ඉදිරිපත් කිරීමේදී එම සහතික ඉහත සඳහන් අරක්කු කොන්දේසි මාලාවේ සඳහන් නියමයන් අනුගමනය කළ යුතුය.

7. ටෙන්ඩර් පත්‍රිකාවකට අදළ තැබෑරුමේ නම හා අංකය ලියුම් කවරයක වම් කෙළවරේ පැහැදිලිව ලියා එකී ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තබා නියමිත ස්ථානයේදී නියමිත දිනයේදී හා වේලාවේදී කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත්වීමට කලින් කච්චේරියට ලැබෙන පරිදි රජයේ දිසාපති නමට ලිපිනය ලියා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

8. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය දිසාපති තැන සතුය.

9. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා දිසාපති තුමා විසින් නියම කරන ලද ඇප තැන්පත් මුදලක් දිසාපති තැනට ගෙවිය යුතුය.

10. සුරාබදු කොමසාරිස් තුමා විසින් අංක 14,857 සහ 1969.6.6 වෙනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ 1969–70 වර්ෂය සඳහා පළ කරන ලද අරක්කු තැබෑරුම් විකිණීමේ කොන්දේසි මාලාවේ සඳහන් වගන්තීන් සැළකිලිමත්ව කියවා බලා ඒ අනුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන ලෙස දන්වමි. වෙනත් විස්තර ඉල්ලුම් පත් මගින් පුත්තලමේ දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලමේ දිසාපති.

1969 ජූනි මස 17 වෙනි දින,
පුත්තලම, දිසාපති කාර්යාලය.

### උපලේඛනය

| අනු අංකය | කොට්ඨාශය | ග්‍රාමය | ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා දිනය හා අවසාන වේලාවන් |
|---|---|---|---|
| 1. | පුත්තලම පළාත් ආණ්ඩු සභාවේ අංක 2 දරණ කොට්ඨාශය | චේනකුඩිරිප්පුව | 1969.8.7 පෙරවරු 10.00 |
| 2. | පුත්තලම් පත්තුව | කුරුවිකුලම | 1969.8.7 පෙරවරු 10.15 |
| 3. | පුත්තලම් පත්තුව | කේකාපොල | 1969.8.7 පෙරවරු 10.30 |
| 4. | පුත්තලම් පත්තුව | කන්දතොඩුවාව | 1969.8.7 පෙරවරු 10.45 |
| 5. | පුත්තලම් පත්තුව | මදුරන්කුලිය | 1969.8.7 පෙරවරු 11.00 |
| 6. | පුත්තලම් පත්තුව | මංගලඑළිය | 1969.8.7 පෙරවරු 11.15 |
| 7. | පුත්තලම් පත්තුව | කට්ටෙයිකාඩු | 1969.8.7 පෙරවරු 11.30 |
| 8. | පුත්තලම් පත්තුව | ඔත්තපානිපෙරිය | 1969.8.7 පෙරවරු 11.45 |
| 9. | පුත්තලම් පත්තුව | මුන්දලම | 1969.8.7 දහවල් 12.00 |
| 10. | පුත්තලම් පත්තුව | ආඩිමුණේ | 1969.8.7 පස්වරු 1.45 |
| 11. | කල්පිටිය | සෝතුපිටිවාඩිය | 1969.8.7 පස්වරු 2.00 |
| 12. | කල්පිටිය | ඒත්තෑලේ | 1969.8.8 පෙරවරු 10.00 |
| 13. | කල්පිටිය | නාරක්කල්ලි | 1969.8.8 පෙරවරු 10.15 |
| 14. | දෙමළ හත්පත්තුව | ඉහළ මන්ඩලාන | 1969.8.8 පෙරවරු 10.30 |
| 15. | උතුරු පිටිගල් කෝරළය | දකුණු උඩප්පුව | 1969 8.8 පෙරවරු 10.45 |
| 16. | උතුරු පිටිගල් කෝරළය | වෙල්ලාවල | 1969.8.8 පෙරවරු 11.00 |
| 17. | උතුරු පිටිගල් කෝරළය | රාජකදළුව | 1969.8.8 පෙරවරු 11.15 |
| 18. | උතුරු පිටිගල් කෝරළය | කරුකුපොනේ | 1969.8.8 පෙරවරු 11.30 |
| 19. | උතුරු පිටිගල් කෝරළය | දෙමටපිටිය | 1969.8.8 පෙරවරු 11.45 |
| 20. | උතුරු පිටිගල් කෝරළය | බණ්ඩාරවත්ත | 1969.8.8 දහවල් 12.00 |
| 21. | උතුරු පිටිගල් කෝරළය | පම්බල | 1969.8.8 පස්වරු 1.45 |
| 22. | උතුරු පිටිගල් කෝරළය | අඹකඳවල | 1969.8.8 පස්වරු 2.00 |
| 23. | උතුරු පිටිගල් කෝරළය | උඩලාවල | 1969.8.9 පෙරවරු 10.00 |
| 24. | හලාවත පළාත් ආණ්ඩු සභාවේ අංක 6 දරණ කොට්ඨාශය | හලාවත කඩමණ්ඩිය | 1969.8.9 පෙරවරු 10.15 |
| 25. | හලාවත පළාත් ආණ්ඩු සභාවේ අංක 7 දරණ කොට්ඨාශය | හලාවත පිටිපන වීදිය | 1969.8.9 පෙරවරු 10.30 |
| 26. | නාත්තන්ඩිය | උතුරු තොඩුවාව | 1969.8.9 පෙරවරු 10.45 |
| 27. | නාත්තන්ඩිය | ඉහළ මහවැව | 1969.8.9 පෙරවරු 11.00 |
| 28. | නාත්තන්ඩිය | කුඩාවැව | 1969.8.9 පෙරවරු 11.15 |
| 29. | නාත්තන්ඩිය | පහළ තල්ගස්අගාර | 1969.8.9 පෙරවරු 11.30 |
| 30. | නාත්තන්ඩිය | තල්විල | 1969.8.9 පෙරවරු 11.45 |
| 31. | නාත්තන්ඩිය | මූදුකටුව | 1969.8.9 දහවල් 12.00 |
| 32. | නාත්තන්ඩිය | දෙමටපිටිය | 1969.8.9 පස්වරු 1.45 |
| 33. | නාත්තන්ඩිය | මොරකැලේ | 1969.8.9 පස්වරු 2.00 |
| 34. | නාත්තන්ඩිය | පහළ කටුනේරිය | 1969.8.10 පෙරවරු 10.00 |
| 35. | වෙන්නප්පුව | උල්හිටියාව | 1969.8.10 පෙරවරු 10.15 |
| 36. | වෙන්නප්පුව | දුම්මලදෙණිය–බටහිර | 1969.8.10 පෙරවරු 10.30 |
| 37. | වෙන්නප්පුව | බොරලැස්ස | 1969.8.10 පෙරවරු 10.45 |
| 38. | වෙන්නප්පුව | වයික්කාල | 1969.8.10 පෙරවරු 11.00 |
| 39. | වෙන්නප්පුව | නංජුන්ඩන්කරය | 1969.8.10 පෙරවරු 11.15 |
| 40. | වෙන්නප්පුව | කෝප්පුතොට | 1969.8.10 පෙරවරු 11.30 |
| 41. | වෙන්නප්පුව | කඹරවිල | 1969.8.10 පෙරවරු 11.45 |
| 42. | වෙන්නප්පුව | ලුණුවිල | 1969.8.10 දහවල් 12.00 |
| 43. | වෙන්නප්පුව | වෙන්නප්පුව | 1969.8.10 පස්වරු 1.45 |

සැ.යු.—අංක 35 උල්හිටියාව සහ 36–බටහිර දුම්මලදෙණිය තැබෑරුම් දැනට පිහිටි ස්ථානය 1969–70 වර්ෂය සඳහා අනුමත කරනු නොලැබේ.

6–1045/2—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## අරක්කු රේන්ද විකිණීම—බදුල්ල දිස්ත්‍රික්කය 69–70

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාලසීමාව තුළ සියළුම සුරාබදු නීති යටතේ දනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි සහ 1969 ජූනි මස 6 වැනි දින අංක 14,857 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරන ලද 1969–70 මුදල් වර්ෂය සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව, අරක්කු පහත සඳහන් ප්‍රදේශයන්හි මිලදී ගැනීම සහ විකිණීමේ තනි අයිතිය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ලංකාවේ සෑම කච්චේරියකින්ම ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පතක් ද, එක් එක් තැබෑරුමට පහත සඳහන් පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවා එම ගෙවීම සඳහා ලබාගත් කච්චේරි කුවිතාන්සියකුත් සමඟ ඉදිරිපත් කළ යුතුයි :—

| අරක්කු තැබෑරුම | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|
| අංක 1 බදුල්ල | ... ... | 2,500 | 0 |
| අංක 2 මඩොල්සිම | ... ... | 1,000 | 0 |
| අංක 3 ලුනුගල | ... ... | 1,000 | 0 |

ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් නිකුත් කරන ලද හෝ බැංකුවකින් මාරු කළ හැකි '' ආරක්ෂක පරීක්ෂණ '' යෙන් හැඳින්වෙන චෙක් පත්වලින් හෝ බැංකුවකින් ගෙවිය හැකි '' ගෙවීමට '' යයි නම් කරන ලද චෙක්පතකින් හෝ මුදල්වලින් හෝ එම මුදල තැන්පත් කළ යුතුයි.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් ඔහුගේ නමින් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 වැනි කොන්දේසිය යටතේ හෝ වෙනත් විදියකින් නුසුදුසු හා ලාංකික නොවන තැනැත්තෙකුගෙන් හෝ නියෝජිතයෙකු මගින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු නො ලැබේ.

4. එක් අයෙකු විසින් එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවළුන් විසින් ද ටෙන්ඩර් පත් ඉදිරිපත් නොකළ යුතුය.

5. සෑම ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර ටෙන්ඩර් පත්‍රිකාවේ වුවමනා කර ඇති සියළුම විස්තර සම්පූර්ණයෙන් පුරවා තිබිය යුතුයි. ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කිරීමට අදහස් කරන මුදල ඉලක්කමෙන් සහ අකුරෙන්ද සඳහන් විය යුතුය. ෆෝර්මයේ යම් වෙනස් කිරීමක් ඇතිවන විට, එම වෙනස් කිරීම් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සනින් සහතික කල යුතුයි. සෑම ඉල්ලුම් පත්‍රයක්ම සාක්ෂිකරුවන් දෙදෙනෙකු විසින් අත්සන් කර තිබිය යුතුයි. මෙහි වුවමනා කර ඇති විස්තර නොමැතිව ඉදිරිපත් කරන සියළුම ටෙන්ඩර් පත්‍රිකාවක් දිසාපති විසින් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ :—

(අ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුයි. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තා වූ ද, ටෙන්ඩර්යේ දක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියයට විසි පහකට අඩු වටිනාකමක් ඇත්තාවූද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම්, අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ, සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදාල තැබෑරුමේ පිහිටීමේ නම්, අංකය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

(ආ) 1968–69 වර්ෂයේ රේන්ද වෙන්දේසි සඳහා ඉදිරිපත් කරන ලද වත්කම් සහතිකයක් 1969–70 වර්ෂයේ රේන්ද වෙන්දේසි සඳහා පිළිගැනීමට නම්, වත්කම් සහතිකයේ උප ලේඛනයේ සඳහන් කර ඇති දේපල විකුණා නැති බවත් කිසිම බැඳීමක් නැති බවත් ඔප්පු කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයයෙන් නිකුත් කරන ලද (ඇන්කම්බරන්ස්) සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුයි.

7. ටෙන්ඩර් පත්‍ර කැඳවීම සඳහා ඇති දන්වීමේ සඳහන් පරිදි අනුමත කරන ලද මෙහි පහත දක්වෙන තැබෑරුම් ලැයිස්තුවේ සඳහන් අංකය ද, ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන තැබෑරුමේ නම ද සීල් කරන ලද ලියුම් කවරයේ වම් පැත්තේ සඳහන් කර ටෙන්ඩර් පත්‍රය එහි බහා එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍රයන් භාරගැනීම අවසන් කරන 1969 අගෝස්තු 3 වැනි දින උප ලේඛනයේ සඳහන් නියමිත වේලාවන්ට ප්‍රථම සෑම ටෙන්ඩර් පත්‍රයක්ම සීල් කරන ලද ලියුම් කවර යේ බහා බදුල්ල කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. එසේ නොමැති නම්, ටෙන්ඩර් පත්‍රය භාරගැනීම අවසන් කරන වේලාවට ප්‍රථම පහත අත්සන් කරන තැනැත්තාට ලැබෙන ලෙස ලියා පදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය.

8. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය බදුල්ල දිසාපති තුමා සතුය.

9. වරප්‍රසාදය මිල දී ගැනීම ප්‍රකාශ කල විට ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිලදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ එම දිනයේ සවස 4.00 පසු නොවී කුමන වේලාවකදී හෝ රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල වශයෙන් දිසාපති තැන විසින් නියම කරන මුදල දිසාපතිතැනට ගෙවිය යුතුය. ලංකා බැංකුවෙන් නිකුත් කරන ලද හෝ මහජන බැංකුවෙන් නිකුත් කළ චෙක්පතක් හෝ බැංකුවකින් මාරු කළ හැකි '' ආරක්ෂක පරීක්ෂණ '' යෙන් හැඳින්වෙන චෙක්පත්වලින් හෝ බැංකුවකින් ගෙවිය හැකි '' ගෙවීමට '' යයි නම් කරන ලද චෙක්පතකින් හෝ මුදල්වලින් හෝ එම මුදල තැන්පත් කළ යුතුය.

10. ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව බදුල්ල කච්චේරියට නොපැමිණියහොත්, ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

11. වැඩි විස්තර බදුල්ල කච්චේරියෙන් දනගත හැකිය.

ඩබ්ලිව්. තිලකරත්න,
අතිරේක දිසාපති, බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969 ජූනි මස 17 වැනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

අනුමත කරන ලද අරක්කු තැබෑරුම්—බදුල්ල දිස්ත්‍රික්කය—1969.10.1 සිට 1970.9.30 දක්වා

| අනුක්‍රමික අංකය | ප්‍රදේශය | තැබෑරුම පිහිට විය යුතු ප්‍රාදේශීය කොටස | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරන දිනය | ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|---|
| | බදුල්ල මහ නගර සභාව ... | බදුල්ල මහ නගර සභාවේ අංක 9 දරණ කොට්ඨාශය තුල | පෙ.ව. 8.00 ... | ප.ව. 7.30 ... | 1969. 8. 3 ... | පෙ.ව. 10.00 |
| | පස්සර ... ... | මඩොල්සිම ගම තුල ... ... | පෙ.ව. 8.00 ... | ප.ව. 6.30 ... | 1969. 8. 3 ... | පෙ.ව. 10.30 |
| | පස්සර ... ... | ලුනුගල සුළු නගර සභාවේ වරිපනම් අංක 101 දරණ ස්ථානයේ | පෙ.ව. 8.00 ... | ප.ව. 7.30 ... | 1969. 8. 3 ... | පෙ.ව. 11.00 |

6–1133—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## මහනුවර දිස්ත්‍රික්කයේ 1969/70 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

අංක 14,857 සහ 1969 ජූනි මස 6 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ ප්‍රසිද්ධ කොට ඇති 1969/70 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු අරක්කු තැබෑරුම් විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුල වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව 1969 ඔක්තොම්බර් මස 1 වෙනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා වූ කාලසීමාව තුල පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයන් මිළ දී ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් 1969 ජූලි මස 18 වෙනි දින ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර—

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම කච්චේරියක රු. 2,500ක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දෙපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධව යථෝක්ත අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිළිමත් විය යුතුය :—

(අ) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන්ද ලිවිය යුතුය. තවද, නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොද තිබිය යුතුය.

(ආ) සෑම වෙනස්කිරීමක් හෝ වචන කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොද සහතික කර තිබිය යුතුය.

මෙකී නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සියත්, වත්කම් සහතිකයත් සමඟ ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම්කවරයෙහි වම් කෙළවර මුදුනේ තැබෑරුම් අංකය සහ නම සඳහන් කර මහනුවර කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් කිරීමට පෙර තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැනට ලැබෙන සේ ලියා පදිංචි කළ සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

4. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උප ලේඛනයෙහි සඳහන් කර ඇත. එකී වේලාවන් හිදී සියළුම ටෙන්ඩර්කරුවන් මහනුවර කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. සාර්ථක ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය 'වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා' යයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 4ට පෙර මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර කච්චේරියේ තැන්පත් කොට යටකී අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුයි. මෙම ගෙවීම මුදලින් ම හෝ බැංකුවක් විසින් 'ගෙවීම සඳහා' යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවෙන් හෝ 'ආරක්ෂිත චෙක්පත්'' නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමටම නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු වේ.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහනුවර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

1969 ජූනි මස 18 වෙනි දින,
මහනුවර කච්චේරියේදී ය.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැන.

### උපලේඛනය

ඉහත සඳහන් කළ අරක්කු තැබෑරුම් ලැයිස්තුව සහ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කරන වේලාවන් :

| අනුක්‍රමික අංකය | නම සහ කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රදේශය | තැබෑරුම: විවෘත කරන වේලාව පෙ.ව. | තැබෑරුම: වසන වේලාව ප.ව. | ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | කොළඹ වීදියේ අරක්කු තැබෑරුම—මහනුවර නාගරිකයේ අංක 17 දරණ ඡන්ද කොට්ඨාශය | කොළඹ වීදියේ සහ ත්‍රිකුණාමල වීදිය මංසන්ධියටත්, කොළඹ වීදිය සහ කැසැල් හිල් වීදියේ මංසන්ධියටත් අතර කොළඹ වීදියේ මහනුවර නාගරිකයේ අංක 17 දරණ ඡන්ද කොට්ඨාශයට අයත් පාර්ශ්වයේ ... ... | 8.00 ... | 7.30 | ...පෙ.ව. 9.30 |
| 2 ... | කටුකැලේ අරක්කු තැබෑරුම—මහනුවර නාගරිකයේ අංක 16 සහ 4 දරණ කොට්ඨාශ ... | මහනුවර පොලිස් ස්ථානය අසල පාලමටත් කටුකැලේ මුස්ලිම් දේවස්ථානයටත් අතර පේරාදෙනිය පාරේ, මහනුවර නාගරිකයේ අංක 16 සහ 4ට අයත් පාර්ශ්වයේ ... ... | 8.00 ... | 7.30 | ...පෙ.ව. 10.00 |
| 3 ... | වහුගේපිටිය අරක්කු තැබෑරුම—උඩ පලාත | වහුගේපිටිය ග්‍රාමය තුල ... ... ... | 8.00 | 7.00 | ...පෙ.ව. 10.30 |
| 4 ... | පුස්සැල්ලාව අරක්කු තැබෑරුම—පුස්සැල්ලාව නගරය | පුස්සැල්ලාව නගර සීමා ඇතුළත ... ... | 8.00 ... | 7.00 | ...පෙ.ව. 11.00 |
| 5 ... | හැටන් අරක්කු තැබෑරුම—හැටන්-දික්ඔය නගර සභාවේ අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය තුල | 8.00 ... | 7.30 | ...පෙ.ව. 11.30 |
| 6 ... | කොටියාගල අරක්කු තැබෑරුම—කොටියාගල නගරය | කොටියාගල නගර සීමාව ඇතුළත ... ... | 8.00 ... | 7.00 | ...මධ්‍යාහ්න 12 |
| 7 ... | හාර්ඩන් හුයිස් අරක්කු තැබෑරුම—අඹගමුව කෝරළය | හාර්ඩන් හුයිස් ග්‍රාමය තුළ ... ... ... | 8.00 | 7.00 | ... ප.ව. 1.30 |
| 8 ... | මස්කෙළිය අරක්කු තැබෑරුම—අඹගමුව කෝරළය | මස්කෙළිය නගර සීමාව තුළ ... ... | 8.00 ... | 7.00 | ... ප.ව. 2.00 |
| 10 ... | පුපුරැස්ස අරක්කු—තැබෑරුම—උඩපලාත | පුපුරැස්ස නගර සීමාව තුල ... ... ... | 8.00 ... | 7.00 | ... ප.ව. 2.30 |

### ටෙන්ඩර් ඉදිරිපත් නොකළ යුතු මහනුවර දිස්ත්‍රික්කයේ වතු කැන්ටීන්

| | | | |
|---|---|---|---|
| 11 ... | උඩ පලාත ... ... | ගලහ, පුපුරාසි වතුයායේ සීමාව තුළ ... ... | වෙළඳම් කරන වේලාව වතුඅධිකාරී විසින් නියෝග කරන පරිදි |
| 12 ... | උඩදුම්බර ... ... | ඌරුගල, වුඩ්සයිඩ් වතුයායේ සීමාව තුළ ... ... | එම |

සටහන.—දැනට තැබෑරුම් පවත්වාගෙන යන ස්ථානයන් 1969/70 රේන්ද වර්ෂය තුලදී තැබෑරුම් පවත්වාගෙන යාමටද ලැබේ යයි ප්‍රතිඥවක් දිය නොහැකිය. සෑම තැබෑරුම් පවත්වන ස්ථානයක් සඳහාම මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ පෙර අනුමැතිය ලබාගත යුතුය.

6-1139—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## අරක්කු රේන්ද විකිණීම—මඩකලපු දිස්ත්‍රික්කය—1969–70

1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ සියළුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් දූනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි සහ 1969 ජූනි මස 6 වැනි දින අංක 14,857 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1969–70 වර්ෂය සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව පහත සඳහන් ප්‍රදේශයන්හි අරක්කු විකිණීමේ තනි අයිතිය මිලදී ගැනීම සඳහා මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් කර ඇති දින සහ වේලාව දක්වා මෙම දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේ දී ටෙන්ඩර්කරුවන් මෙම දිසාපති කාර්යාලයට පැමිණිය යුතුය.

2. රු. 3,000කට එක් එක් ටෙන්ඩර් පත්‍රය වෙනුවෙන් මුදල් තැන්පත්කර ලබාගත් කච්චේරි කුවිතාන්සි ඉදිරිපත් කොට, ඕනෑම දිසාපති කාර්යාලයකින් කොළඹ සුරාබදු කොමසාරිස් ගේ කාර්‍යාලයෙන්, ත්‍රිකුණාමල සුරාබදු කොමසාරිස්ගෙන් සහ මඩකලපු සුරාබදු අධිකාරීගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. 1969 ජූනි මස 6 වැනි දින අංක 14,857 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකොට ඇති 1969–70 වර්ෂය සඳහා වූ අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල අංක 4 (3) (1) දරණ කොන්දේසිය අනුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අදහස් කරන ටෙන්ඩර්කරුවන් සෑම ටෙන්ඩර්පත්‍රයකටම වටිනාකමේ සහතිකයක් ඇමිණිය යුතුය.

4. නිවැරදි ලෙස සකස්කර නොමැති ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. වැඩි විස්තර මඩකලපුවේ දිසාපති කාර්‍යාලයෙන් ලබාගත හැක.

ඩී. නෝසයියා,
මඩකලපු දිස්ත්‍රික්කයේ වැඩබලන දිසාපති.

1969 ජූනි මස 19 වැනි දින,
මඩකලපු දිසාපති කාර්යාලයේ දී ය.

### සඳහන් කරන ලද ප්‍රදේශයන්

| අංකය හා කොට්ඨාශය | කැබැරම පිහිටිය යුතු ප්‍රාදේශීය කොටස | ටෙන්ඩර්පත් අවසන් වන වේලාව සහ දිනය පු.භා. | |
|---|---|---|---|
| 1. කෝරළේ පත්තු ... | වාලච්චේනෙයි ගම ඇතුලත | 10.00 | 26.7.69 |
| 2. ඒරාවූර් සුළු නගර සභා ... | ඒරාවූර් සුළු නගරසභා ප්‍රදේශය ඇතුලත | 10.30 | 26.7.69 |
| 3. මඩකලපුව නාගරික සභා | මඩකලපු නාගරික සභාවේ 7 වැනි ආසනය තුළ | 11.00 | 26.7.69 |
| 4. එරුවිල් පෝරතිවපත්තු... | එරුවිල් ගම ඇතුළත ... | 11.30 | 26.7.69 |

6–1061—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත්

## මත්පැන් බලපත්‍ර

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ ප්‍රකාර, 1930 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 200 දරණ සුරාබදු නිවේදනයේ සඳහන්ආකාරයට, 1970 සැප්තැම්බර් මස 30 වැනි දිනව අවසන් වන බලපත්‍ර කාල සීමාව තෙක් මත්පැන් බලපත්‍ර ලබාගැනීම සඳහා කොළඹ, කළුතර, ගාල්ල,නුවරඑළිය, මහනුවර, අනුරාධපුරය, යාපනය සහ කුරුණෑගල දිසාපතිවරුන්ගෙන් 1969 ජූනි මස 4 වැනි දින ඉල්ලුම් කර තිබෙන බව මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ඉල්ලුම් කරන ලද බලපත්‍රයේ විස්තර | දූනට ඇති බලපත්‍ර/ බල පත්‍රය අළුත්වැඩියා කිරීම හෝ අළුත් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ද | බලපත්‍ර අවශ්‍යව ඇති ස්ථානයේ පිහිටීම |
|---|---|---|---|
| දුම්රිය සාමාන්‍යාධිකාරී, කොළඹ 10 | ල. දු. දෙ. දුම්රිය භෝජනාගාර සේවය (සිල්ලර විකිණීම) | අළුත්වැඩියා කිරීම ... | දුම්රිය ස්ථානය, කොළඹ කොටුව කොළඹ |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, මරදන, කොළඹ 10 |
| එම ... | එම ... | එම ... | දුම්රිය භෝජන මැදිරි සහ බුෆේ මැදිරි |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, අළුත්ගම |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, ගාල්ල |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, නානුඔය |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, මහනුවර |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, අනුරාධපුර |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, යාපනය |
| එම ... | එම ... | එම ... | දුම්රිය ස්ථානය, පොල්ගහවෙල |

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී,
ල. දු. දෙ.

ඉල්ලුම්කරුගේ නම

තැ. පෙ. 355,
කොළඹ,
12.6.69.

6–1017—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

---

# වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමක්

ජාතික නිවාස සහකාර කොමසාරිස් ඩී. එස්. වීරසිංහ මහතාගෙන් මට ලැබී ඇති බලය පිට, කොළඹ, ජේ. එන්. පරනවිතාන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 3297 හා 1953.12.15 දින දරණ උකස්කරය යටතේ සහ 1955.3.22 දින ආර්. නාගලිංගම් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 600 දරණ දෙවන උකස්කරය යටතේ ද මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් වේයන්ගොඩ, කලගෙඩිහේන පාරේ අංක 38 හි එම්. සේනාරත්න මහත්මියගෙන් (ගම්පහ දිස්ත්‍රික් උසාවියේ අංක 1743/එස්. පී. එල්. දරණ නඩුවේ ප්‍රකාර, ඩබ්ලිව්. එල්. එම්. අබේසේකර මහතාගේ බූදලේ නීත්‍යානුකූල නියෝජිතවරිය) 67.11.15 දිනතෙක් අයවිය යුතු රුපියල් තිස් දස් එකසිය විසිතුන (රු. 30,123.00) අයකර ගැනීම සඳහාත්, එසේම, 1967.11.15 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා හෝ තවදුරටත් වූ රුපියල් හාරදාස් පන්සිය අසූ තුනයි ශත විසිපහ (රු. 4,583.25) ක මුදලක් සම්බන්ධයෙන් වන පොලී මුදල් වර්ෂයකට සියයට පහ (5%) ප්‍රමාණයට යථෝක්ත උකස් කර ප්‍රකාර 1967.11.15 දින සිට විකිණීමේ දිනයතෙක් එකතු වන සියළුම දඩ මුදල් සමග අයකර ගැනීම සඳහාත්, එසේ අයකර

ගැනීමේදී දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු අයකර ගැනීම සඳහාත්, මීට අමුනා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියළුදේත් 1969 ජූලි මස 20 දින ප. ව. 4 ට පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර මගෙන් හෝ කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ජාතික නිවාස කොමසාරිස්තුමාගෙන් හෝ ලබා ගත හැක.

ඩබ්ලිව්. ඒ. ඩී. එස්. දිසානායක,
බලයලත් වෙන්දේසිකරු.

අකුරුමුල්ල,
දෙල්ගොඩ,
1969 ජූනි 18 දින දීය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ, සියනෑ කෝරලේ, වේයන්ගොඩ සුළු නගර සභා සීමාව තුල, පත්තලගෙදර පිහිටි වරිපනම් අංක 389 (දැන් කලගෙඩිහේන පාරේ අංක 40) දරණ, කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක ඊ. 346/245 යටතේ ලියාපදිංචිකර ඇති, උතුරින් කේ. ජුසේ සිල්වාගේ ඉඩමෙන්ද, නැගෙනහිරින් පාරෙන්ද, දකුණින් එස්. විලියම් අප්පුහාමිගේ ඉඩමෙන් සහ බටහිරින් කුරුප්පු අප්පුහාමිලාගේ අගිලිස් මුදලාලිගේ ඉඩමෙන්ද, මායිම් වූ පී. පොන්සේකා බලයලත් මිනින්දෝරු තැන විසින් සකසන ලද අංක 5203 හා 1907.9.30 දිනැති මාණක සැලැස්ම අනුව රුඩ් එකයි, පර්චස් කාලක (අක්. 0, රූ. 1, පර්. 1/4) ප්‍රමාණයෙන් යුත්, "එගොඩබිම්විට" නැමැති ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි.

6–1116—69.6.27 දින අංක 14,860 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. **රජයේ මුද්‍රණාලය** වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1969**

| මාසය | පළ කිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හාවේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජූනි .. | 69. 6.6 | සිකුරාද | ... | 69. 5.30 | සිකුරාද | දවල් | 12.00 |
| | 69. 13.6 | සිකුරාද | ... | 69. 6.6 | සිකුරාද | දවල් | 12.00 |
| | 69. 20.6 | සිකුරාද | ... | 69. 6.13 | සිකුරාද | දවල් | 12.00 |
| | 69. 27.6 | සිකුරාද | ... | 69. 6.20 | සිකුරාද | ප.ව. | 3.30 |
| ජූලි ... | 69. 7. 4 | සිකුරාද | ... | 69. 6.27 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.11 | සිකුරාද | ... | 69. 7. 4 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.18 | සිකුරාද | ... | 69. 7.11 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 7.25 | සිකුරාද | ... | 69. 7.18 | සිකුරාද | ප.ව. | 3.30 |
| අගෝස්තු ... | 69. 8. 1 | සිකුරාද | ... | 69. 7.25 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8. 8 | සිකුරාද | ... | 69. 8. 1 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.15 | සිකුරාද | ... | 69. 8. 8 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.22 | සිකුරාද | ... | 69. 8.15 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 8.29 | සිකුරාද | ... | 69. 8.22 | සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් ... | 69. 9. 5 | සිකුරාද | ... | 69. 8.29 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.12 | සිකුරාද | ... | 69. 9. 5 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.19 | සිකුරාද | ... | 69. 9.12 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69. 9.26 | සිකුරාද | ... | 69. 9.19 | සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් ... | 69.10. 2 | බ්‍රහස්පතින්ද | ... | 69. 9.26 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.10. 9 | බ්‍රහස්පතින්ද | ... | 69.10. 2 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.17 | සිකුරාද | ... | 69.10. 9 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.10.24 | සිකුරාද | ... | 69.10.17 | සිකුරාද | දවල් | 12.00 |
| | 69.10.31 | සිකුරාද | ... | 69.10.24 | සිකුරාද | දවල් | 12.00 |
| නොවැම්බර් ... | 69.11. 7 | සිකුරාද | ... | 69.10.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 69.11.14 | සිකුරාද | ... | 69.11. 6 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 69.11.21 | සිකුරාද | ... | 69.11.14 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.11.28 | සිකුරාද | ... | 69.11.21 | සිකුරාද | ප.ව. | 3.30 |
| දෙසැම්බර් ... | 69.12. 5 | සිකුරාද | ... | 69.11.28 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.12 | සිකුරාද | ... | 69.12. 4 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 69.12.19 | සිකුරාද | ... | 69.12.12 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 69.12.26 | සිකුරාද | ... | 69.12.18 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.